2018 සැප්තැම්බර්
01 කාණ්ඩය 10 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®

සටන් කරන තාරුණ්‍යයට




02
අවිදු අඳුර පළවා හැරී...

04
මත්ද්‍රව්‍ය හා මරණ දඬුවම...

11
කලාකරුවාට මිලක් වෙනුවට...

# අවිදු අඳුර පළවා හැරි ගැලීලියෝ ගැලිලි

## (ක්‍රි.ව. 1564 - ක්‍රි.ව. 1642)



ලෝකය අඳුරින් මුදවාලීමට ආලෝකයට හැකි වුවත් ඊට අවිද්‍යාවේ අඳුර පලවා හැරිය නොහැකියි. මෙයින් සියවස් ගණනාවකට එපිට යුගය යනු එලෙස අප ජීවත් වන ලෝකය අවිදු අඳුරෙන් වෙළා ගත් සමයකි. එහෙත් එම අඳුර පළවා හරිමින් විද්‍යාවේ ආලෝක කිරණින් ලෝකය නැහැවූ සැබෑම ධෛර්යවන්ත මිනිසුන් පිළිබඳ තොරතුරු මානව ඉතිහාසය තුළ විටින් විට වුව අපට හමු වේ. නමුදු ඒ අතරින් බොහෝ දෙනෙක් පිළිබඳව හෝ ඔවුන්ගේ භාවිතයන් පිළිබඳව හෝ දන්නේ ඉතාම අතළොස්සකි. එලෙසින්ම අද අප කථා කරන ගැලීලියෝ ගැලිලි පිළිබඳව ද කුඩා කල පටන්ම අප බොහෝ දෙනෙක් දැන සිටිය ද ඔහු පිළිබඳ බොහෝ දෙනෙක් නොදත් දේ ද ඇත්තේය.

නූතන භෞතික විද්‍යාවේ පියා ලෙසින් හැඳින්වෙන ගැලීලියෝ, පීසා සරසවියේ අධ්‍යාපනය ලබන සමයේ පටන්ම ප්‍රසිද්ධව සිටියේ නොබියව තම නිදහස් අදහස් ප්‍රකාශ කරන්නෙක් ලෙසයි. ඔහු විසින් සිදුකළ විද්‍යාත්මක සොයාගැනීම් රාශියකි. දිනක් ඔහු පීසා හි දෙව්මැදුරේ එල්ලා ඇති ඔරලෝසුවේ "බට්ටා" දෙපසට පැද්දීමට ගත වන කාලය සමාන බව සිය නාඩි ස්පන්දන වේගය ඇසුරින් පිරික්සා තහවුරු කරගත්තේය. එම නිරීක්ෂණය පදනම් කරගනිමින් ලම්බකයක් එක් පැත්තක සිට අනෙක් පැත්තට පැමිණීම සඳහා ගත වන කාලය තීරණය වන්නේ එම ලම්බකයේ දිග අනුව බව තහවුරු කරගත්තේය. තවත් වරෙක දී ඔහු සුප්‍රසිද්ධ පීසා හි ඇල වෙන කුලුනේ සිට එකිනෙකට අසමාන බරින් යුත් යකඩ ගෝලයන් දෙකක් එකවර බිමට අතහැරිය. එහිදී එම ගෝලයන් දෙකම එකවර බිමට පතිත වීම නිසාවෙන් එතෙක් තහවුරුව තිබූ "බරින් වැඩි වස්තූන් සැහැල්ලු වස්තූන්වලට වඩා වේගයෙන් බිම පතිත වේය" යන ඇරිස්ටෝටල්ගේ මතය බිඳහැරීමට සැලැස්විය. මේ අතර වඩාත් සාර්ථක දුරේක්ෂයක් මුල්වරට නිපදවූයේ සහ ඒ අනුව සඳ මතුපිට කඳු හා ගැඹුරු ආවාට රාශියක්ම පවතින බව මුල්වරට සොයාගත්තේ ද ඔහු විසිනි.

වැදගත්ම හා නොපතළම කාරණය වන්නේ සූර්ය කේන්ද්‍රවාදය පිළිබඳව ගැලීලියෝ දැක්වූ අදහසයි. "පෘථිවිය වටා සූර්යයා භ්‍රමණය වේ" යනුවෙන් එතෙක් පල්ලිය මගින් ගෙනගිය අවිද්‍යාත්මක දුර්මතයන් අභියෝගයට ලක් කරමින් ඔහු සිය "Dialogue on the two chief world systems" නම් කෘතිය එළිදැක්විය. එයින් එකල කතෝලික පල්ලිය තුළින් ඉගැන්වූ අවිද්‍යාත්මක අසත්‍යයන් පිළිබඳව හාස්‍යයට ලක්කෙරිණි. මෙයින් උරණ වූ ආගමික ධර්මාධිකරණය විසින් "සූර්ය කේන්ද්‍රවාදය අසත්‍යයක්" බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලෙස ගැලීලියෝට දැඩිව බලපෑම් කරනු ලැබීය. එහිදී එම බලපෑම් හමුවේ ඔහුට ඊට අකමැත්තෙන් වුවද එකඟ වීමට සිදු වූවත් ඔහු විසින් එහිදී ද එක් නිර්භීත ප්‍රකාශයක් සිදුකරමින් කියා සිටියේ "මම සූර්ය කේන්ද්‍රවාදය පිළිගත්තත් නැතත්, පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීම නොනවතින බවයි." මේ අයුරින් විද්‍යාත්මක සොයාගැනීම් රැසක් හරහා තමන් හෙළි කළ සත්‍යය වෙනුවෙන් පෙනී සිටි හෙයින් සිය ජීවිත කාලය තුළ කිහිප වරක්ම සිරගත වීමට ද ගැලීලියෝට සිදු විය. අවසන ඔහු සිය අවසන් හුස්ම හෙළුවේද නිවාස අඩස්සියක් තුළ සිරදඬුවම් විඳිමින් සිටියදීමය.

ඉඳින් ලෝකය එසේ යැයි, ලෝකය මෙසේ යැයි කියමින් අවිද්‍යාත්මක දේශනාවන් හරහා මිනිසුන්ව අන්ධානුකරණයට ලක් කොට තිබූ අඳුරු යුගයක ඊට එරෙහිව සිය බුද්ධිය මෙහෙයවූ ශ්‍රේෂ්ඨයින් අතළොස්ස අතරට ගැලීලියෝ ගැලිලි නම් ඒ අසහාය මිනිසාගේ නාමය ද එක්වූයේ එලෙසිනි.

කතෝලිකයින්ට කියවීමට තහනම් කර තිබූ පොත් අතර අවුරුදු සිය ගණනක් තිස්සේම ගැලීලියෝගේ පොත්වල නම් ද ඇතුළත් වී තිබිණි. ඉක්බිති ගැලීලියෝට සිදු වූ අසාධාරණය පිළිබඳව ඔහුගේ මරණයෙන් වසර 350ක් ඉක්ම ගිය තැන 1992 තරම් මෑතකදී පල්ලිය වෙනුවෙන් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීමට දෙවැනි ජුවාන් පාවුළු පාප් වහන්සේ විසින් කටයුතු කළේය.

## රට ගොඩනැගිය හැක්කේ ජාතික සමගියෙන් පමණි



සිංගප්පූරු ගිවිසුම හරහා අමාත්‍ය මලික් සමරවික්‍රම සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් රට පාවාදී තිබෙන බවත් රටට අත් වී ඇති ඉරණමෙන් රට ආරක්ෂා කරගත හැක්කේ ජාතික සමගියෙන් පමණක් බවත් අනුර දිසානායක සහෝදරයා සඳහන් කරයි. ඒ අගෝස්තු 16 වන දින බලංගොඩ නගරයේ දී සංවිධානය කර තිබූ "රට රකින්නේ ජාතිවාදයෙන් ද, ජාතික සමගියෙන් ද" යන සම්මන්ත්‍රණයේ දී ය. එහිදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක චිරංග ගුණසේකර සහෝදරයා, තරුණ හින්දු සම්මේලනයේ ප්‍රධාන ලේකම් ආචාර්ය සතිශ්කුමාර් සිවලිංගම් මහතා, කලීල් රහුමාන් මවුලවි තුමා සහ සමාජවාදී තරුණ සංගමයේ රත්නපුර දිස්ත්‍රික් සංවිධායක විශ්ව කුමාර සහෝදරයා යන අය ද අදහස් දැක්වූහ. මෙම සම්මන්ත්‍රණය "එක රටක් - මනුපවුරක් " වැඩසටහනට සමගාමීව සමාජවාදී තරුණ සංගමය මඟින් සංවිධානය කර තිබුණි.

## EPF කොල්ලකෑමට හා බදු අය කිරීමට එරෙහිව



EPF අරමුදල කොල්ලකෑමට හා වැටුපෙන් බදු අය කිරීමට එරෙහිව සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක් අගෝස්තු 17 දින කොළඹ පිහිටි රජයේ ලිපිකරු සංගම් ශාලාවේදී පැවැත්විණි. ලංකා විදුලි සේවක සංගමය විසින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණය ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක වසන්ත සමරසිංහ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ඊට ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රංජන් ජයලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයින් රැසක් සහභාගී වූහ.

## නකල්ස් රැක ගනිමු



ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වටිනාකමක් උසුලන නකල්ස් රක්ෂිතය හා කඳු පංතිය ආශ්‍රිතව වර්තමාන් රජය විසින් දියත් කර ඇති ඉඩම් කොල්ලය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් අගෝස්තු 02 දින මාතලේ හෝටල් පාසල් පරිශ්‍රයේ දී පැවැත්වීය. කෙසේ වුවද නකල්ස් ස්වාරක්ෂක කලාපයේ අක්කර 21000ක් විකිණීමට ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා විසින් කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණද සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීන්ගේ විරෝධතා නිසා එම උත්සහය ඇනහිට තිබේ. ඒ "ජීවයේ අයිතිය" පරිසර සංවිධානය, "දුම්බර අපේය" සංවිධානය, "මාතලේ පරිසර මිතුරෝ" සංවිධානය ඇතුළු සංවිධාන ගණනාවක මැදිහත් වීමෙනි.

## ILO කලාපීය සමුළුවට ජවිපෙන් නියෝජනයක්



කලාපීය සේවකයින්ගේ අවම වැටුප් සකස් කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ කලාපීය සමුළුව සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා ද සහභාගී විය. ඔහු අගෝස්තු 19 දින ඉන්දියාවේ නව දිල්ලි නුවර බලා පිටත් විය. මෙම සමුළුව සඳහා රටවල් 15 ක පමණ නියෝජිතයින් සහභාගී වූ බවද දැනගන්නට තිබේ.

## අග්නිදිග සිසු උද්ඝෝෂණයට කඳුළු ගෑස් හා ජල ප්‍රහාර




අග්නිදිග විශ්වවිද්‍යාලයීය තාක්ෂණ පීඨයේ ගැටලුවලට කඩිනම් විසඳුම් ඉල්ලමින් පැවැත්වූ උද්ඝෝෂණයක් අතරතුර එම සිසුන්ට ජල හා කඳුළුගෑස් ප්‍රහාර එල්ල විය. ශිෂ්‍යයින්ට වසර එකහමාරක පමණ කාලයක් තිස්සේ කිසිදු විභාගයකට ඉදිරිපත් වීමට අවසර නොදීම, සිසුන් 17 දෙනෙකුගේ පන්ති තහනම් කිරීම හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම ආදී කරුණු මුල් කරගනිමින් පසුගිය අගෝස්තු 21 දින කොළඹ දී පැවති මෙම උද්ඝෝෂණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අසළට එක් වූ අවස්ථාවේදී මෙලෙස ප්‍රහාරයට ලක්විණි.

## ගුරු විදුහල්පති හිඟ වැටුප් කප්පාදුවට එරෙහිව මානව හිමිකම් පැමිණිල්ලක්

පසුගිය රාජපක්ෂ පාලන සමය තුළ හා ඊට පෙරත් ගුරු විදුහල්පතිවරුන්ට හිමිවිය යුතු හිඟ වැටුප් අහිමි කරමින් එය මංකොල්ල කා ඇති බව ගුරු විදුහල්පති පෙරමුණ ප්‍රකාශ කරයි. එබැවින් සමස්ත ගුරු විදුහල්පතිවරුන්ට හිමි විය යුතු මෙම හිඟ වැටුප් ගෙවීමට කටයුතු කිරීම ආණ්ඩුවේ වගකීම බවද එම පෙරමුණේ කැඳවුම්කරු මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය. ඒ හිඟ වැටුප් කප්පාදුවට එරෙහිව මානව හිමිකම් කොමිසම වෙත කරන ලද පැමිණිල්ල පසුගිය අගෝස්තු 20 දින විභාගයට ගන්නා අවස්ථාවට සහභාගී වෙමිනි.

# මත්ද්‍රව්‍ය හා මරණ දඬුවම



මත්ද්‍රව්‍ය නමැති බුවල්ලාගේ අඬුවලට සිර වීමෙන් සමාජ, ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික, සෞඛ්‍ය හා නීති යනාදී ක්ෂේත්‍රයන් ගැටලු රාශියකට මුහුණ දී තිබේ. එම ගැටලුකාරී තත්ත්වය වඩාත් ඉස්මතු වන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැක්කේ, මීට මාස දෙකකට පමණ පෙර හෙරොයින් 302 kg අත්අඩංගුවට ගැනීමත් සමඟ ජනාධිපතිවරයා විසින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එල්ලුම්ගහ ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීමයි.

1980 දී පමණ හෙරොයින් මත්ද්‍රව්‍ය ලොව පුරා ව්‍යාප්ත වීම ආරම්භ විය. එය අද වන විට ලොව සෑම අස්සක් මුල්ලක් නෑරම ව්‍යාප්ත වූ ජාවාරමක් බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ පමණක් වසරකට මත්ද්‍රව්‍ය භාවිතය නිසා 30 000කට ආසන්න පිරිසක් මිය යන බව වෛද්‍ය වාර්තා මඟින් හෙළිකරයි. එසේම ශ්‍රී ලාංකිකයන් විසින් වසරකට රුපියල් බිලියන 90 කට වැඩි මුදලක් දුම්වැටි ලෙස පුළුස්සා, ශරීර රෝගාතුර කරගනියි. ඕනෑම මත්ද්‍රව්‍යයකට ඇබ්බැහි වූ පුද්ගලයෙකුගේ ගුරු මත්ද්‍රව්‍යය (Teaching drugs) ලෙස සැලකෙන්නේ දුම්වැටියයි. මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රධාන සහ මූලාරම්භය සනිටුහන් කරන දුම්වැටි භාවිතය මෙරටෙහි අඩුවෙමින් පවතියි. (1995 සිට 2017 දක්වා වූ සංඛ්‍යා දත්ත අනුව) ඒ අනුව ලොව දුම්වැටි භාවිතය අඩු රටවල් අතරට ශ්‍රී ලංකාව එක්වෙමින් තිබේ. නමුත් ඒ වෙනුවට භාවිතයෙන් භයානක ප්‍රතිඵල වැඩි, මත්වීමේ ප්‍රවණතාවය වැඩි මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය ඉතාමත් සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතියි.

දුම්වැටිය අත්හරින පරම්පරාවට වෙනත් ආදේශක හඳුන්වා දෙමින් මත්ද්‍රව්‍ය අලෙවි සමාගම් හා පුද්ගලයින් විසින් විවිධ මත්කුඩු ජාවාරම්හි නිරත වෙයි. මෑත කාලයේ සමාජය පුරා ගංජා පිළිබඳ වෙනස් වූ කතිකාවතක් ඇති වුණි. ගංජා විද්‍යානුකූලව අහිතකර නොවන බවත් ඖෂධයක් ලෙස ද භාවිතා කරන බවත් පවසමින් විශාල ප්‍රචාරණයක් ලබා දුණි. ඒ සඳහා සමාජ මාධ්‍ය ජාලා සහ විද්‍යුත් මාධ්‍ය ආයතන කිහිපයක්ද ඉදිරිපත් විය. මත්ද්‍රව්‍ය පිළිබඳ නිවැරදි අධ්‍යයනයන් නොකර මාධ්‍ය ප්‍රචාරණයන් ලබාදුන් අවස්ථා එමටය. ටෙලි නාට්‍ය, චිත්‍රපට, වෙළඳ දැන්වීම් හෝ පසුතල නිර්මාණයේදී යොදාගන්නා පෝස්ටර්, බැනර් යනාදිය මඟින් මත්ද්‍රව්‍ය සඳහා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රචාරණයට ඉඩහසර ලබාදෙයි. ඒ වෙනුවෙන් විශාල මුදල් සම්භාරයක් එම ආයතන වෙත ලැබෙන අතර එයින් සමස්ත සමාජයටම සිදුවන දැවැන්ත හානිය පිළිබඳ කිසිඳු තැකීමක් හෝ නොමැතිය.

මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට ඇබ්බැහි වී සිටින්නේ ඉතාමත් දුප්පත් පංතියේ ජනතාවයි. නමුත් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ගෙන්වීම හෝ බෙදාහැරීම සිදු කරන්නේ ධනකුවේරයන් විසිනි. මත්ද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් අතෙහි තිබූ පමණින් දුප්පත් මිනිසුන් නීතියට හසු වුවත් මත්ද්‍රව්‍ය තොග වශයෙන් ගෙන්වන හෝ බෙදාහරින හෝ නිපදවන ධනවතුන් කිසිවෙකුත් නීතියේ රැහැනට හසු නොවෙයි. ඔවුන් නීති දැලේ සිදුරු සොයමින් එයින් රිංගා යයි. නැතිනම් නීතිය වෙනස් කර ගනිමින් තමන් ආරක්ෂා වෙයි.

එසේම වර්තමානයේදී පාසල් සිසුන්, යෞවන යෞවනියන් මත්ද්‍රව්‍ය වෙත ගොදුරු වීමේ ප්‍රවණතාවය ඉහළ ගොස් තිබේ. එයට නොයෙක් හේතු සාධක රැසක් තිබුණද ළමුන් හා කාන්තාවන් මත්පැන් වෙත යොමුවීම කෙරෙහි බියර් මිල පහළ යාමද ප්‍රධාන හේතුවක් බවට පත්ව තිබේ. බියර් මත්වීමේ ප්‍රවණතාවය අඩු මත්පැන් විශේෂයක් වුවත් එයද මත්ද්‍රව්‍ය වෙත හුරුකිරීමේ ප්‍රධාන මාර්ග යක් බවට පත්වී තිබේ.

මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් තිබිය යුතුය. එහිදී මත්ද්‍රව්‍ය සැපයුම අඩු කරන අතරම මත්ද්‍රව්‍ය ඉල්ලුමද අඩු කළ යුතුය. ඒ සඳහා නිවැරදි ක්‍රමවේද හඳුනාගත යුතුය. මත්ද්‍රව්‍ය වැටලීම් මඟින් සැපයීම අඩු කළ හැකි අතර පුනරුත්ථාපනය මඟින් භාවිතයෙන් වළක්වා ගත හැකිය. නමුත් වර්තමානයේ වැටලීම් තුළින් මත්ද්‍රව්‍ය වෙළඳපොළට නිකුත් වීම අඩුවන විට ඉල්ලුම වැඩි වී ඇත. ඒ නිසාම ඒකකයක වටිනාකමත් ඉහළ ගොස් ඇත.

මත්ද්‍රව්‍ය වර්තමානයේ සියලුම පද්ධති වෙත පැතිර ගොස් සමාජය දැඩි ලෙස රෝගාතුර කර ඇත. පාසල් පද්ධතිය තුළ, ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මංගල, අවමංගල වැනි ඕනෑම උත්සව අවස්ථාවක් සඳහා වර්තමානයේ මූලිකත්වය හිමිවන්නේ මත්ද්‍රව්‍ය වෙතයි. එය සමාජය විසින් අනිවාර්ය සාධකයක් බවට පත්කරගත් සමාජ සංස්කෘතියක් ගොඩනගාගෙන ඇත. එසේම එමඟින් සමස්ත ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි සෘජු බලපෑම් ඇතිකර තිබේ.

කළු සල්ලිද මත්ද්‍රව්‍ය සමඟ අත්වැල් බැඳගත්තකි. අද වනවිට කළු සල්ලි විශාල ලෙස මත්ද්‍රව්‍ය ව්‍යාපාරය ඔස්සේ ලොව වටා සැරිසරයි. එක් රටක නිෂ්පාදනය කරන්නා වූ මත්ද්‍රව්‍ය තොගයක් රටවල් කිහිපයක් පසුකර ගොස් තවත් රටක භාවිතා කරයි. නිෂ්පාදනය, ප්‍රවාහනය සහ භාවිතය යන අංග තුන සිදුවනුයේ සිතාගැනීමට වත් නොහැකි තරම් දුර ප්‍රමාණයන්ගෙන් යුතු රටවල් තුනක විය හැක. මත්ද්‍රව්‍ය ව්‍යාපාරයේ හැඩය හා ස්වරූපය එයයි.


ශ්‍රී ලංකා පොලීසිය, රේගුව, අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ වෙනත් මේ සම්බන්ධ සිවිල් සංවිධාන එකට එක්ව ක්‍රියාත්මක විය යුතු වුවත් මෙතෙක් මෙරට තුළ මෙම ආයතන සියල්ල ඒකාබද්ධ වී සිදුකරන ක්‍රියාවලියක් නොමැත. සත්‍ය වශයෙන්ම මෙම සියලු ආයතන සමඟ නීතියත්, ජනමාධ්‍ය ආයතනත් එක්ව විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රතිපත්ති රාමුවක් හා නීති පද්ධතියක් මත ක්‍රියාත්මක විය හැකිනම් තවදුරටත් මත්ද්‍රව්‍ය උවදුර රටට මෙතරම් හානිදායක නොවේ. එකිනෙක වෙනස් අරමුණු මුදුන් පමුණුවා ගැනීමට ගොඩනැගුණු ආයතන හා සංවිධාන තම අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් කටයුතු කරමින් සිටී. ඒ අතර තවත් කොටසක් විසින් අනෙක් සියලු දේට වඩා තම ලාභය, ධනය හා බලය වෙනුවෙන් මත්ද්‍රව්‍ය පිළිබඳ සාහිත්‍යක් මාධ්‍ය කලාවක්, නාට්‍ය, චිත්‍රපට තිරපිටපත් වෙළඳ දැන්වීම් යනාදිය නිර්මාණය කරමින් තිබේ.

මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සිදුවන රිය අනතුරු ප්‍රමාණයද මෙතෙකැයි ගණනය කළ නොහැකි ලෙස දිනෙන් දින වර්ධනය වෙයි. ඒ හැරුණු විට ගෙදර ආර්ථිකයට දායක වන්නවුන් පවා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුවහොත් එම පවුල ආර්ථිකමය ලෙස කඩා වැටීම නවතාලිය නොහැක. ශ්‍රම බලකායෙන් අඩකටත් වඩා වැඩි පුරුෂ පාර්ශවය මත්ද්‍රව්‍යයන්ට ගොදුරු වූ මත්ලෝලීන් පිරිසක් වීම රටේ නිෂ්පාදන ක්‍රියාවලිය බිඳ වැටීමට සෘජුවම බලපායි. දිගුකාලීනව මත්ද්‍රව්‍ය භාවිතය ලිංගික බෙලහීනතාවයටද හේතු වෙයි. මෙවැනි සාමාජීය හා සෞඛ්‍යමය ගැටලු රාශියක් ඇතිවන අතර එය රටක් ගමන් කරන දිශානතිය වෙනස් කිරීම කෙරෙහිද සෘජුවම බලපායි.


අද වනවිට ශ්‍රී ලංකාවේ මන්නාරම් මුහුදු සීමාව මත්ද්‍රව්‍ය ප්‍රවාහනයේ ප්‍රධාන සංධිස්ථානයක්ව පවතියි. එහෙත් මෙතරම් විනාශයක් මෝරා වර්ධනය වනතුරුත් නීතිය කරවන ආයතන හෝ අනෙකුත් කණ්ඩායම් සිටියේ කොහේදැයි යන ප්‍රශ්නය මතුවෙයි. එවන් තත්වයක් තුළ ජනාධිපතිවරයාගේ දඬුවම යන ප්‍රකාශය තවත් පුස් වෙඩිල්ලක් නොවනු ඇතැයි කිවහැක්කේ කාටද? එසේම මරණ දඬුවම හෝ මොනයම් හෝ දඬුවමක් ලබාදුන්නත් මත්ද්‍රව්‍ය නිෂ්පාදකයන් හා මහා පරිමාණ ජාවාරම්කරුවන් දේශපාලන බලය හා ධන බලයෙන් ඉන් මිදෙනවා මිස දඬුවම් ලබන බව අප මෙතෙක් දුටුවේ නැත. නමුත් මත්ද්‍රව්‍ය භාවිතයෙන් රෝගාතුර වී මරණ දඬුවම ලබන්නා වූ බොහෝ මිනිසුන් රෝහල් ඇඳන් තුළ දී අපට දැකගත හැකිය.

# අන්තර්ජාලයෙන් මුදල් ඉපැයීම ඇත්තක්ද?

අ.පො.ස සාමාන්‍ය පෙළ සහ උසස්පෙළ මෙන්ම උසස් අධ්‍යාපනය ද නිමවා පැමිණෙන වර්තමාන තාරුණ්‍යය වඩාත් ඉක්මනින් මුදල් ඉපයීමට විවිධ ක්‍රම අත්හදා බලමින් සිටී. මේ අතර අප රට තුළ අන්තර්ජාලයෙන් මුදල් ඉපයීම නැමැති මාතෘකාවට මෑත කාලයේ වඩා වැඩි අවධානයක් යොමු වී ඇත. මෙය ලෝක මට්ටමෙන් පැතිර දැනට අවුරුදු ගණනාවක් ගත වී තිබේ.



ඇත්තටම මෙහෙම මුදල් උපයන්න පුළුවන් ක්‍රමයක් තියෙනවද? ඔව්. දැනට ලංකාව ආශ්‍රිතව මේ ආකාරයට මුදල් උපයමින් පූර්ණකාලීනව රැකියාවක් ලෙස එම කාර්යයේ නිරත වන පිරිස 17,000ත් 22,000ත් අතර ප්‍රමාණයකි. ඊට අමතරව අර්ධකාලීන ලෙස එහි නිරත වන විශාල ප්‍රමාණයක් ද වේ. ලංකාවට විශාල විදේශ විනිමයක් මොවුන් විසින් රැගෙන එනු ලබන්නේ කිසිදු රාජ්‍ය මැදිහත් වීමක් හෝ කිසිදු අනුග්‍රහයක් හෝ නොමැතිව තම ස්වෝත්සාහයෙන්මයි. එහෙත් මෙම ක්ෂේත්‍රයේ නියැලෙන තරුණයන්ට විශාල ගැටලු රාශියකට මුහුණ දීමටද සිදුවන අතර ඒ පිළිබඳව රජය හෝ කිසිදු වගකිව යුතු ආයතනයක් හෝ මැදිහත් වී නොමැත. ඉදිරියේදී ඒ සම්බන්ධවද සාකච්ඡා කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.




ඕනෑම අයෙකුට තම දක්ෂතාවය මත අන්තර්ජාල රැකියා සිදුකළ හැකි අතර ලැබෙන ආදායම ද දක්ෂතාවය මත රඳා පවතී. උදාහරණයක් ලෙස ග්‍රැෆික් ඩිසයින් කරන අයෙකුට තම දැනුම භාවිතා කරමින් විදේශිකයින්ගේ විවිධ නිර්මාණ කටයුතු සිදුකර දිය හැකිය. ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය ලාංඡනයේ (LOGO) සිට අනෙකුත් සියලු දෑ සිදු කර දිය හැකිය. මෙහිදී වැදගත්ම කාරණය වනුයේ අප රට තුළ නිර්මාණයක් සිදු කර උපයන මුදලට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් උපයා ගත හැකි වීමයි.

එමෙන්ම මෙය අන්තර්ජාලයෙන් මුදල් ඉපයීමට වඩා පුළුල් වූවකි. සේවා සැපයීමට අමතරව ebay වැනි වෙබ් අඩවිවල භාණ්ඩ විකිණීමෙන්ද මුදල් ඉපයිය හැකිය. විවිධ වෙබ් අඩවි මෙවැනි ආකාරයට සේවා සැපයීමට මෙන්ම අපගේ භාණ්ඩ අලෙවියටද පහසුකම් සපයමින් අතරමැදියන් ලෙස කටයුතු කරයි.

මේ අතර අන්තර්ජාලයෙන් මුදල් ඉපයීම පිළිබඳව උගන්වන විවිධ ආකාරයේ පාඨමාලා විවිධ මිල ගණන් යටතේ පවත්වන අයුරු වර්තමානයේදී දැකිය හැකිය. ඉන් බොහෝ ඒවායින් සිදු කරනුයේ ජනතාවගේ මුදල් වංචා කිරීමයි. එමනිසා එවැනි වංචනිකයින් පිළිබඳවද ඉදිරියේදී සාකච්ඡා කරමු.

මෙම ලිපිය තුළින් ඉහත ආකාරයට සේවය කළ හැකි වෙබ් අඩවි පිළිබඳව මෙන්ම ඒවායේ සේවය කරන ආකාරය පිළිබඳවද ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තුවෙන් සිටින සහ දැනට සේවය කරමින් සිටින අයගේ ගැටලු පිළිබඳවද ඉදිරියේදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. ඉදින් ඔබගේ ගැටලු ද අප වෙත යොමු කරන්න.



සටහන:
ප්‍රියන්ත දිසානායක

අපගේ ඊමේල් ලිපිනය
Email: syuforwardnews@gmail.com

## bookiයෙන්









FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# වෙනස්ව හිතන්න පටන් ගමු!

අපි කාටත් තමන් කැමතිම විදියට ඉන්න තියෙනවනම් කියලා ගොඩක් වෙලාවට හිතෙනවා ඇති. මොකද අපි බොහොමයක් දෙනා එදිනෙදා ජීවිතේ ගතකරන්නේ තමන්ට කැමති විදියට නෙවෙයි. ගොඩක් වෙලාවට සමාජයේ අපි ජීවත් වෙනකොට අනුගමනය කරන නීති වගේම රීතීන් කොටසකුත් තියෙනවා. ඒවට අකමැත්තෙන් වුනත් අපට එකඟ වෙන්න වෙලා තියෙනවා.

ඒත් අපි හැමෝම තනි තනිව තියෙන සිස්ටම් එකට අනුව හිතන්න ගත්තම ඒකෙ අවුලක් නෑ වගෙත් දැනෙනවා. අපි ඉන්න විදිය හැන හිතලා බැලුවොත්, හැමෝම ඉන්නෙ සතුටින් නෙවෙයි කියලා තේරෙනවා. මගේ කැමැත්ත ඉටුකරගන්න හිතාගෙන අනෙකා ගැන නොහිතම කටයුතු කරන නිසා අපි එකිනෙකා අතර ප්‍රශ්න ඇති වෙන්න පටන් ගන්නවා. ඒ හින්දා අපි අනෙකා දිහා හතුරෙක් විදියටත් බලන්න පුරුදු වෙලා ඉන්නවා. ඒක කොයිතරම් වැරදිද? ඒ අතරෙ අපි අතරේ කලිනුත් කිව්වා වගේ සමාජයේ පැවැත්මට කියලා හදාගත්ත නීතිරීති එහෙමත් තියෙනවා. එමගින් අපි බොහෝ දෙනෙකුගේ කැමැත්තට ඉඩ අහුරලා තියෙන බව ඔබත් හොඳින්ම දන්නවා.

හැබැයි මේ නීති රීති ඇවිත් තියෙන්නේ කොහොමද කියලා ඔබ හොයලා බලලා තියෙනවද කියලා අපි ඔබෙන් ඇහුවොත් බොහෝ විට පිළිතුරු ලැබෙන්නේ "නැහැ" කියලයි. එහෙනම් මේ කාගේ කැමැත්තක්ද ක්‍රියාත්මක වෙමින් තියෙන්නේ කියලා නිකමටවත් ඔබ හිතලා බැලුවද? ඇත්තට මේ ධනය තියෙන, බලය තියෙන අය කැමති විදිය කියලා කිව්වොත්, එහෙම නැත්නම් පාලකයන්ගේ කැමැත්ත කියලා කිව්වොත් ඔබ ඊට එකඟද?

අන්න ඒ හින්දා තමයි මේ තියෙන නීති රීති කැඩුවහම පොලීසියෙන් ඇවිත් ගහලා ගිහින් කූඩුවට දාන්නේ. නඩු අහලා හිරේ දාන්නෙ. ඒ නිසා ඇත්තටම අපි බොහෝ දෙනෙකුගේ කැමැත්තට ඉඩදෙන සම්ප්‍රදායන් හා රීතිවලින් හැදුණ සමාජ වටපිටාවකට අපි කැමතියි නේද? අපේ කැමැත්තෙන් සියයට සියයක් නොවුනත් අඩුම තරමේ සියයට වැඩි ප්‍රමාණයකින්වත් බලාපොරොත්තු ඉටුකරගන්න පුළුවන් පසුබිමක් හැදෙනවනම් අපි එකඟයි නේද?

ඉතින් එහෙම ක්‍රමයක් ගැන අපි අද ඉඳන්වත් හිතන්න පටන් ගත්තොත් අපි අකමැති දේට ඉඩදෙමින් යන මේ සමාජ වටපිටාව වෙනස් කරන්න අපිට පුළුවන් නේද? ඒකට මේ සමාජ වටපිටාව ගැන හිතන්න පුළුවන් ඔළුවකුයි, තමන් වගේම දුක් විඳින අනෙකා ගැන දැනෙන හදවතකුයි විතරයි ඕනා. අන්න එහෙම හදවතක් සහ ඔළුවක් ඇති ඔබට මේ ගෙවෙන සාහිත්‍ය මාසය කියලා කියන්නේ හොඳ ආරම්භයක් ගන්න හොඳම කාලයක්, ඉඳින් අනෙකා ගැන හිතන, අනෙකාට ආදරය කරන, සමාජයට ආදරය කරන නවීන තරුණයෙක් වෙන්න කියලා අපි ඔබටත් ආරාධනා කරනවා.

### අගෝ. 12

**දුම්රිය වර්ජනය හා සියලු කම්කරුවන්**



පැවති දුම්රිය වර්ජනයත් සමඟම මගී ජනතාවට සිදුවූ අපහසුතාවය පිළිබඳ පළ වූ නොයෙකුත් සටහන් FB හරහා දක්නට ලැබිණි. කිසියම් වෘත්තියක නියැලෙන සේවකයන් විසින් සිය වෘත්තිය ක්‍රියාමාර්ගයන් ගනු ලබන විට එම ක්ෂේත්‍රයෙන් සිදුවන සේවාවන් අත්හිටුවීම සාමාන්‍යයයි. එනිසාම එම සේවාවන් ලබන පිරිස් හැමවිටම පීඩාවට ලක්වීම නොවළැක්විය හැකිය. නමුදු අප රට තුළ එක් එක් සේවාවන්හි නියැලී සිටින පිරිස් වෙනත් සේවාවක හෝ කර්මාන්තයක නියැලී සිටින සහෝදර කම්කරුවන් ගැන හෝ ඔවුන්ගේ මෙම වෘත්තීය අරගලයන් පිළිබඳව හෝ නොසිතන පිරිස් බවට පත්ව ඇති බවක් දක්නට ඇත. ඉහත දුම්රිය වර්ජනය දා සිදුවූ ඇතැම් සිදුවීම් තුළින්ද දක්නට ලැබුණේ එවැනිම තත්වයකි.

දුම්රිය සේවාවන්හි නියැලී සිටින සේවක පිරිසට විරෝධය දැක්වූ අය අතරින් බොහෝ දෙනෙක්ම වෙනත් ආයතනවල කම්කරුවන්ය. එසේම අනෙකුත් වෘත්තීය අරගලවල දී බොහෝ දුම්රිය සේවකයින් දක්වන්නේද මෙවැනිම ප්‍රතිචාරයකි. ඉඳින් අද දුම්රිය සේවකයන්ට දක්වන විරෝධය හෙට ලංගම සේවකයන්ට විය හැකිය. තවත් දිනෙක රෝහල් සේවකයින්ට එරෙහිවිය. ඒ නිසා අප කවුරුත් තේරුම්ගත යුතු සත්‍යයක් තිබේ. වැඩ කරන ජනයාගේ සාධාරණ අයිතීන් දිනාගැනීම වෙනුවෙන් අප කාටත් පැවරුණු කාර්යභාරයක් ඇත. ඒ අරගලය පොදු අරගලයක් වූ දිනෙක අප කාගේත් ජීවිත මීට වඩා සොඳුරු වනු නොඅනුමානය.

### අගෝස්තු 15



පුත්තලම වෙරළ තීරයට රසායනික අපද්‍රව්‍ය ප්‍රමාණයක් ගොඩගසා තිබීම පිළිබඳ ඡායාරූප සටහන් රැසක් මාධ්‍ය හරහා ප්‍රචාරය විය. ඒත් සමඟම FB පිටු අතරද ඒ පිළිබඳ වැඩි විස්තර ප්‍රමාණයක් දක්නට විය. මුහුදු ජලය දූෂණයට ලක්වන ප්‍රධාන ආකාර ලෙස රසායනික අපද්‍රව්‍ය මුහුදට එක්කිරීම සැලකිය හැකියි. නොයෙකුත් රටවලින් සිදුකරන මම ක්‍රියාවලිය හරහා සාගර ජලය දූෂණයට ලක්වීම මහා පරිමාණයෙන් සිදුවන්නේය.

ඉහත සිදුවීමට අදාළ අපද්‍රව්‍ය යනු අසල්වැසි ඉන්දියාවේ රෝහලක් වෙතින් බැහැර කළ ඒවා ලෙස සැලකෙන අතර මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් රජයක් ලෙස රාජ්‍යතාන්ත්‍රික විරෝධයක් පළකළ යුතුව තිබේ. නමුදු අප රටේ පාලකයන් විසින් තම දේශපාලනික දුප්පත්කම නිසාවෙන් මෙකී ක්‍රියාවලිය මඟහැර සිටිනු දක්නට ලැබේ. ධනවාදය අද වන විට ලෝකය පුරා අසාර්ථකත්වයට පත්වෙමින් ඇති අතර ලොව පුරා සිදුවන මෙවැනි ක්‍රියා හරහා මහා පරිමාණ පරිසර විනාශයක් ද සිදුවෙමින් පවතී. ධනවාදයේ සැබෑ ස්වරූපය එයයි. ඒ තුළ පරිසර දූෂණය වැනි දේ වැළැක්වීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ගයන් ඉතා අල්පය. ඒ නිසා පරිසරයට ආදරය කරන්නන් විසින් මෙකී ධනවාදය ලොව පුරා පරාජයට පත්කිරීමට පෙළ ගැසීමට කාලය එළඹ ඇත. ධනවාදය පෙරළා දැමීමේ සටන පරිසරයට ආදරය කරන්නවුන්ගේද සටනක් නොවන්නේ යැයි කිව හැක්කේ කාටද?

### අගෝස්තු 18

**හොර මත්පැන් පෙරූ පොහොට්ටු මන්ත්‍රී අත්අඩංගුවට**

ඉහත ප්‍රවෘත්තිය පිළිබඳ කියවෙන දැන්වීමක් FB පිටු අතර දක්නට ලැබිණි. පසුගිය අප්‍රේල් මාසයේදී දිවුරුම් දුන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් අතරින් වැඩි ප්‍රමාණයක්ම පොහොට්ටුවේ මන්ත්‍රීවරුන්ය. එහෙත් ඔවුන්ගෙන් බොහෝ පිරිසක් අද කරමින් සිටින්නේ ළමුන් පැහැරගෙන යාම, සොරකල්ලි සමඟ ගොස් ජනතාවගේ දේපළ කොල්ලකෑම, හොර දැව ප්‍රවාහනය සහ සංවිධානාත්මක අපරාධ ආදී විවිධාකාරයේ සමාජ විෂමාචාර ක්‍රියාවන්ය. ඉඳින් ජනතාව තමන් තෝරාපත් කර යැවූ මන්ත්‍රීවරුන් පිළිබඳ පසුවන්නේ දැඩි ලැජ්ජාවකිනි. එහෙයින්ම මැතිවරණ සමයන්හිදී විවිධ බේගල් ඇදබාමින් ගමට පැමිණෙන මෙවන් දූෂිතයින්ට ලබාදිය යුතු හොඳම දඬුවම ලබා දීමේ වගකීම ඇත්තේ ද ජනතාවටය. ඒ වෙනුවට තමන්ගේ එම අත්හැරිය නොහැකි වගකීම ඉවතලන ජනතාවකට උරුම වන්නේ පසුතැවිලි වීම හා දුක පමණක් බවද ලියා තැබිය යුතුමය.

### අගෝස්තු 22



බස්නාහිර පළාත් සභාවේ සිදුකිරීමට ගිය මහා පරිමාණ මුදල් නාස්තියක් සම්බන්ධව ජ.වි.පෙ. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා විසින් සිදුකළ හෙළිදරව්වත් සමඟ FB පිටු තුළත් ඒ පිළිබඳ විශාල සංවාදයක් ගොඩනැගී තිබිණි. රටේ ජනතාවගේ දේපළ ධනපති දේශපාලඥයින් විසින් ගසාකෑමත්, වංචාවට හා දූෂණයට ලක්කිරීමත් අද ඊයේ සිදුවූවක් නොව, ඉතිහාසයේ පටන්ම සිදුවන්නකි. ඒ අනුව මෙහිදී සිදුකිරීමට ගිය මුදල් නාස්තිය ද ඉතා විශාල වන අතර විදෙස් රටකින් ගෙන්වා පළාත් සභාවේ සවිකිරීමට සැලසුම් කළ පුටුවක මිල රුපියල් හය ලක්ෂ හතළිස් දහසකි.

පාසල්, රෝහල්, මංමාවත් වෙනුවෙන් යෙදවීමට ඇති මුදල් මන්ත්‍රීවරුන්ගේ සැප පහසුව වෙනුවෙන් යෙදවීමට උත්සහ කළේ එලෙසය. කෙසේ වුවද මෙම යෝජනාව පළාත් සභාව තුළට ගෙන එන විට ඊට විරුද්ධ වූයේ මන්ත්‍රීන් 08 දෙනෙකි. ඒ ජ.වි.පෙ මන්ත්‍රීන් 06 දෙනා සහ තවත් මන්ත්‍රීන් දෙදෙනෙකි. ඉඳින් සැබෑ ජනතා නියෝජිතයින් මෙම ආයතන තුළට යැවුවේනම් මේ ආකාරයේ ජනතා මුදල් කාබාසිනියා කිරීම් වළක්වනවා පමණක් නොව එම මුදල් ජනතා අවශ්‍යතා වෙනුවෙන්ම යෙදවීමටද තිබුණි.

### අගෝස්තු 27

**පළාත් සභා සීමානීර්ණ කොමිෂන් සභා වාර්තාව පාර්ලිමේන්තුවේදී පරාජයට පත්වේ**

ඉහත ප්‍රවෘත්තියට අදාළ තවත් විස්තර රැසක් සමඟ Fb පිටු පිරෙන්නේ මෙම සිදුවීමේ වූ විශේෂත්වය නිසාම වන්නට පුළුවන. දැනට මාස දහයකට ආසන්න කාලයකට පෙරාතුව නව පළාත් සභා මැතිවරණ ක්‍රමයක් ගෙන ආවේ ආණ්ඩුව නියෝජනය කරන එජාපයත් ශ්‍රීලනිපයත් එකතු වීමෙන්ය. එම අවස්ථාවේදී එය ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් ගත්විට යහපත් ක්‍රියාවක් වූයේ පැවති ක්‍රමයට වඩා කාන්තා නියෝජනය ශක්තිමත් වීමත් කොට්ඨාසයට වගකියන ජනතා නියෝජිතයෙක් පත්වීමත් යන කරුණු නිසාවෙන්ය.

අද වනවිට එය ජයග්‍රහණය කිරීමට යාමේදී පනත ගෙන ආ පිරිස්ද එයට විරුද්ධව ඡන්දය ලබාදී ඇත. එසේ සීමානීර්ණ වාර්තාව පැරදවීම යනු පළාත් සභා ඡන්දය පැවැත්වීම ස්ථිර ලෙසම තවත් මස හතර පහකට කල් දැමීමකි. අනෙක් කරුණ නම් එදා ජවිපෙට චෝදනා කළ ඒකාබද්ධයේ පිරිස් අද ආණ්ඩුව සමඟ එක්වෙමින් මෙම සීමා නිර්ණය පැරදවීමට කටයුතු කර තිබීමයි. ඒ කුමන අරමුණකින්ද යන්න පිළිබඳව ඔවුන්ගෙන්ද පෙරළා ජනතාව ප්‍රශ්න කළ යුතුව ඇත.

# වන්නි කවි සලකුණ

## විමලරත්න කුමාරගම

වන්නියේ ගහකොළ සතා සීපාවා මෙන්ම ගොවිතැනින් දිවිසරි කරගන්නා මිනිසුන් ද මේ කාෂ්ටක ජීවිතයට හැඩගැසී ඇත්තේ පරිණාමවාදයේ සඳහන් වන උච්චතෝන්නතිය අනුව නොවේ. ඒ මේ කඨෝර පරිසරය සමඟ ගැටීම හැර වෙනත් විකල්පයක් නොමැති බව පසක් කරගත් යථාර්ථවාදී මනෝමූලික චින්තනය අනුවය.

විමලරත්න කුමාරගමයන් 1919 වසරේ ජනවාරි මස 18 වන දින නාරම්පනාවේ උපත ලබා මහනුවර කීර්තිමත් ධර්මරාජ විදුහලේ සිප්සතර හදාරා 1942 වසරේ මුල් වරට රජයේ ලිපිකරුවෙකු ලෙස අනුරාධපුර කච්චේරියේ සේවයට සපැමිණියේය. අනතුරුව 1944 වසරේදී ආනමඩුව ප්‍රාදේශීය ආදායම් පාලක ලෙස පත්වීම් ලැබීය. එදා පටන් වන්නිය පිළිබඳ ඔහුගේ සිත තුළ එතෙක් පැවති අඳුරු තිරපට එකිනෙක ගිලිහෙමින් වන්නියේ සැබෑ තතු නිරාවරණය වත්ම ඒ ඔස්සේ ගලා ගිය කාව්‍ය පරිකල්පන දහරාවන් මඟින් වන්නි ජන ජීවිතය, විවිධ පැතිකඩ ඔස්සේ හරවත්ව කවි බසින් ලෝකයට අනාවරණය වන්නට විය.

වන්නි ගැමිදිවියේ සැඟවුණු කටුකත්වය, කර්කශ බව නිසාම ඔපවැටුණ ජීවන චර්යාවන්ගෙන් උපන් නිර්ව්‍යාජත්වය මඟින් කුමාරගමයන්ගේ කාව්‍ය පරිකල්පනය නව මඟකට යොමු කළේය.

***පෙර දැක නොමැතිමුත් සුන්දරහාමි විසින්***
***මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින්***
***ගෙඩියක් කඩා ගෙන ගෙමිදුල තැඹිලි ගසින්***
***පිළිගැන්වීය මට සොම්නස පිරුණ ඇසින්***

පාතදුම්බර සීතල කඳුකරයේ සිට හද්දා වන්නියට ගිය මුල්ම දිනයේදී සුන්දරහාමි අබිමුව කුමාරගමයන් අත්දුටු ඒ සුන්දර ආගන්තුක සත්කාරය ඔහුගේ කවියේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කළ බවක් හැඟීයයි.

ඉහත සඳහන් කළ සුන්දරහාමි කවියාට මුල්වර හමු වූ දිනයේ දැක්වූ ආගන්තුක සත්කාරය මත කවියා තුළ සුන්දරහාමි කෙරේ ඇති වන්නේ පැහැදීමක් නොව, මෙතරම් කඨෝර පරිසරයක් තුළ ලෙංගතුකම උතුරන නිර්ව්‍යාජ ගැමියෙකු දක්නට ලැබීමේ විශ්මයෙකි.

එපමණක්ද නොව එවකට සමාජයේ ඉතා උසස් පිළිගැනීමක් සහිත ''ඩියාරෝ හාමුදුරුවෝ” තනතුරේ අනුහසින් අහිංසක ගැමියන්ට රාජ උෘෂ්ණය පැතිරවීම මෙන්ම දේශපාලකයන්ට හා උසස් නිලධාරී පැළැන්තියට පිරිත් නූල් ගැටගසන දේවාලාධිපති නායකහිමිවරුන්ගේ අන්තේවාසිකයින් විමද කුමාරගමයන් නිරවශේෂවම හෙළා දුටුවේය.



***මට කුමකට ද පන්සල කුමට මල්මිට***
***මා මෙහි ආවෙ වන්නිය වෙතැති ඇල්මට***
***වන්නිය දැවෙද්දී ඇයි අමුතු සිල් මට***
***කළුළක් පුදමි සිරිපද කිරණ ඇල්ලට***

දළදා මාළිගයේ සෙවණැල්ල වැටෙන පාතදුම්බර සිට දුරකතර ගෙවා කුමාරග මයන් වන්නිය වෙත සපැමිණීමේ ජීවන අදිටන ඉතා සැකෙවින් සංක්ෂිප්ත කොට මෙම පද හතර තුළින් නිරූපණය වේ.

*වන්නිය දැවෙද්දී ඇයි අමුතු සිල් මට*

යන වැකිය තුළ ප්‍රතීයමාන වන කවියාගේ ධනාත්මක ආකල්පය යනු ඒ දවසට නොව දශක ගණනකට ඉදිරිය බලා ජන ජීවිතයේ සංවර්ධනය උදෙසා තැබූ පියවරකි. එවන් උතුම් වූ පැතුමක් හද තුළ කකියන සැබෑ මානව හිතවාදියෙකු ලෙස පමණක් නොව ඒ පැතුම මල්ඵල ගැන්වීමට නිලබලය හැසිරවීමේ වගකීම අතදැරූ නිලදරුවෙකු ලෙස ද කුමාරගමයන් “වන්නියේ රසවතා” යන විරුදාවලියට වඩා ''වන්නියේ වීරයා'' යන විරුද කිරුළින් පුදදෙනු ලැබිය යුතු සුවිශේෂී චරිතයකි.

“වන්නියේ මල”, “හරක් හොරා”, “අයියනායක”, “ආරච්චිරාල” “යන්තම් බේරුණා”, “වලස් දඩයම” සහ “හේරත් හාමි” වැනි කුමාරග මයන්ගේ කාව්‍ය පරිකල්පනා මඟින් බාහිර සමාජය එතෙක් නොදුටු වන්නි ජන දිවියේ විවිධ පැතිකඩයන් අපූරු මානයන් ඔස්සේ ලෝකය වෙත ගෙනහැර පෑවේය.

***අලියා වැටුණු වැව සිටි හේරත් හාමි***
***මා වැනියකු වුවද මම වැදගත් වීමි***
***මිනී කපන මුත් ඒ හේරත් හාමි***
***ඔහු මට වඩා විසි තිස් ගුණයක් දැමි***

හේරත් හාමිගේ රාජකාරිය මිනී කැපීම වුවා සේම කවියා ද රාජ්‍ය සේවකයෙකි. ඊටත් වඩා තත්වයෙන් උසස් රාජ්‍ය සේවකයෙකි. එසේ වුවද කවියාගේ දර්ශනය වනුයේ වඩා වැදගත් වන්නේ වන්නි ජීවිතය හෝ රැකියාවේ තත්වය නොව මිනිසත්කම යන්නයි. කවියාගේ ස්වයං නිරීක්ෂණය තුළින් හේරත් හාමිගේ චරිතාංග තුළ සැඟවුණ උසස් ලකුණු නොසඟවා පැවසීමට කවියා තුළ තිබූ නිසඟ නිර්ව්‍යාජත්වය කෙතරම් අගනේද?

***ගංගොඩ වටා මෝරන වන ලැහැබ මැන***
***අහුමුළු නැර සිය අණසක පතුරු වන***
***බලවත් අයියනායක දෙන ගොදුරු ගෙන***
***මේ අය රකිනු මැන යන එන සියලු තැන***

ස්වකීය ප්‍රාඥත්වය හෝ දාර්ශනිකත්වය විහිදමින් ගැමියන්ගේ ඇදහිලිවලට සමච්චල් කරන පුහු පාණ්ඩිත්වය කවියා ඉඳුරාම බැහැර කරයි. ගැමියාට, ගැමිදිවියට පිළිසරණක් වේ නම් ප්‍රාඥත්වය ද කැප කිරීමට තරම් කවියා තුළ ඇති නිර්භයංකාරත්වය කොතරම් අගනේද ?

වෙඩි වැදී මරු විකලෙන් දඟලන වැලහින්න තම දරු දෙදෙනාගේ දිවිරැක ගැනීමට වෙහෙසීම දකින කවි සිත තුළ ඇතිවන කම්පනය පාඨකයන්ගේ හදවත ද කීරි ගස්වයි.

***ගොළුවන් කියන දේ වැටහෙන සවන් පෙති***
***මා සතු වෙන්ට ඒ දවස සිට පටන් ගති***
***දරුවන් දකින විට සිය මැණියන් නැති***
***ඒ හැම දෙනම මගෙ ළඟ නෑ සියන් වෙති***

කුමාරගමයන්ගේ වර්ණනා බාහුල්‍යයෙන් තොර රීතිය මඟින් පුද්ගල චරිත මෙන්ම ජීවන සංසිද්ධි ද භාවාතිශය ගුණයෙන් තොරව වුවද සිත් කාවදින අයුරින් නිරූපණය වූ බව විචාරකයින්ගේ පිළිගැනීමයි.

මේ වනවිට කුමාරගමයන් මීට දශක හතරකට පමණ පෙර දුටු වන්නි ජන සමාජයේ හේරත් හාමිලා වෙනුවට ඔවුන්ගේ දරුමුණුබුරු පරම්පරාවෝ අද ඒ බිමේ උරුමකරුවන්ව සිටිති. සංවර්ධනයේ නාමයෙන් කෙරෙන විවිධ සමාජීය පරිවර්තනවලට එකී නවමු පරම්පරාවන් මුහුණ දුන්න ද කුමාරගමයන් එදා වන්නියේ තැබූ කවි සලකුණ අදත් ඔවුන් සමරන්නේ අපමණ භක්ත්‍යාදරයෙනි.

***සංහිඳ ළඟ හාරයට කිරි ඉතිරීම***
***කෙම්මුර දවස්වල පානෙන් සැරසීම***
***කොළ අතු කඩා ගස් දෙබලක දැවටීම***
***මා නොකෙරුවත් නොකෙළෙම් එය ගැරහීම***

කවියා සංහිඳ සරණ නොගියද මේ ගැමියන්ගේ විශ්වාසය සමච්චලයට ලක් නොකර අවසානයේ ඉන් පිහිටක් ලැබදෙන ලෙස අයියනායකටම ආයාචනා කරයි.

කෙසේ වුවද හෙතෙම භෞතිකවාදී දැක්මක් සහිත කවියෙකු ලෙසද ඔහු අතින් ලියැවුණු ඉහත කාව්‍ය සංග්‍රහයන් හැදෑරීමෙන් පවා විද්‍යාමාන වෙයි.

# ජීවිතයේ සරදම හමුවේ නොසැලුණු 'මිනිසෙකුගේ ඉරණම'



යුද්ධය යනු අමිහිරි මතක රාශියක් ඉතිරි කරමින්, ජන ජීවිත සුනු විසුණු කර දමන දුක්ඛදායක කුණාටුවක් වැන්නකි. මිහයිල් ෂොලහොව් විසින් රචිත 'මිනිසෙකුගේ ඉරණම' යනු සෝවියට් රුසියන් කෙටිකතාවකි. ඊට පසුබිම් වනුයේ කුරිරු ලේ පිපාසිත නට්සිවාදී ජර්මන් හමුදාව හා සෝවියට් හමුදාව අතර පැවති බිහිසුණු යුද්ධයේ යුධ පෙරමුණේ සිටි රතු හමුදා සොල්දාදුවෙකුගේ චරිතයකි.

යුද්ධය කෙතරම් කුරිරු වුවද, තම මානව දයාව, පරිත්‍යාගශීලීත්වය හා ප්‍රේමය වැනි රමණීය ගුණාංග මුදුන්පත් කර ගනිමින් බිහිසුණු යුද්ධයේ අඳුරු ප්‍රතිවිපාක හමුවේ වුවද, නිර්භීතව මිනිසත්කමේ ප්‍රතිබිම්බය විදහා දැක්වූ මේ අපූරු රතු හමුදා සොල්දාදුවා නමින් සොකොලොව් විය.

මිනිසුන්ගේ ජීවිතයේ මිහිර කෙමෙන් වියැකී යන විට, එම දුෂ්කර කාලය සඳහා ඔහු කෙතරම් නම් සූදානම් විය යුතුද?

සොකොලොව්ගේ මව, පියා සහ සහෝදරියන් සාගතයෙන් මිය යන අතර ඔහුගේ බිරිඳ සහ දරුවන් යුද්ධය නිසා මිය යන්නේ ඔහුගේ ජීවිතයට මැකිය නොහැකි අඳුරු පැල්ලම් එකතු කරමිනි.

යුද්ධයේ ඝනාන්ධකාරය පරදවා නැගෙන දේශප්‍රේමය තුළින් මිනිසෙකුගේ සැබෑ නිර්භීතකම හා එඩිතරකම ඉස්මතු වන අයුරු මෙම රතු හමුදා සොල්දාදුවා කෙරෙන් මනාව පිළිබිඹු වේ. යුධ පෙරමුණේදී තම කාර්යභාරය මැනවින් ඉටු කරන සොකොලොව් අවාසනාවන්ත ලෙස ජර්මන් යුධ සිරකරුවෙකු බවට පත් වන අතර කුරිරු නාසි පාලනය යටතේ අනේක විධ වධ වේදනා විඳී.

'ඉතුරු වුණේ ඇටෙයි හමයි විතරයි. තමන්ගේ ඇටසැකිලි කූඩුව ඇදගෙන යන්නවත් හයිය හත්තියක් නෑ. ඒ වුණාට කරබාගෙන වැඩ කරන්න ඕනේ.'

ඔහු සිතාගත නොහැකි තරමේ ජර්මන් හමුදා කුරිරුකම් ඉවසා සිටියේ සිය මව්රටට ආපසු යාමේ උදාර චේතනාව හදවතේ බුර බුරා නැගෙන බැවිනි. ඔහුගේ එඩිතරකම කුමකින් වසන් කරන්නද? මිනිස් ජීවිතයේ අවසාන අංශු මාත්‍රය දක්වාම පොඩිපට්ටම් කරමින් අමිහිරි මතක ඉතිරි කරන යුද්ධය සහ එහි වේදනාකාරී අඳුරු මතකයන් විසින් සෑම මොහොතකම ඊට මුහුණ පෑවුන්ව නොමරා මරා දමයි.

සොකොලොව්ගේ හදවත මහා විශාලය. ඔහු දුක සඟවාගෙන තම මාතෘ භූමිය වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමෙන් නොනැවතී, අහිංසක අනාථ දරුවෙකුට පියෙක් වී ඔහුගේ ද දරුවාගේ ද ජීවිත අලංකාර කිරීමට ප්‍රයත්න දරයි. ඒ ඔහු සතු මානව දයාව ඔප් නැංවුණු උච්චතම අවස්ථාවකි. තමා විඳි කුරිරු පීඩනය අන් අය මත නොහෙළා තම මානව දයාව, නොසැලෙන අධිෂ්ඨානය පමණක් විදහා දක්වන සොකොලොව් යනු ශ්‍රේෂ්ඨ රුසියන් භූමියේ හටගත් රූස්ස ගසක් වැනිය.

'යුද්ධය නිසා මහලු වුවන් ද, පැසුණු හිසකේ ඇත්තන් ද හඬන්නේ සිහිනයෙන් පමණක් නොවේ. සිහින නොදැක නොනිදා සිටින විට පවා ඔවුහු හඬති, වැලපෙති. විශේෂිතම කාර්යය නම් දෙකොපුල් දිගේ ගලා යන කඳුළු කැට දරුවාට නොපෙන්වා ඔහුගේ ළඳරු හදවත තුවාල නොකිරීමයි.'

වසර තිහක යුද්ධයකට හා අඳුරු අතීතයකට හිමිකම් කියන අපටද 'මිනිසෙකුගේ ඉරණම' කෙටිකතාව තුළින් හදවත හාරා පැළ කරගත යුතු බීජයන් බොහෝමයක් ඇත. තම ජීවිතයේ විඳි මොනයම්ම හෝ කුරිරු වේදනාවක්, සමස්ත සමාජය මතින් පා කිරීම නොව, එම වේදනාව වෙනත් අයෙකු ද නොවිඳීම සඳහා තම අවසන් හුස්ම බිඳ තෙක්ම සටන් කිරීමේ වටිනාකම පිළිබඳව මිනිසෙකුගේ ඉරණම කෙටි කථාව කියවීම තුළින් ඔබට සංවේදනය වනු ඇත.

## සරදියෙල්ගේ කොලම

අලුතෙන්ම ව්‍යාප්ත වෙන්න පටන් ගත්ත මත් පෙති වර්ගයක් විකුණපු, ඉස්කෝලේ සිකියුරිටි අයියව පොලීසියෙන් අල්ලලා. ජීවිතේ තිත්ත වෙලා ඉන්න අපේ තරුණ කොල්ලො කෙල්ලො සමහරවිට හිතනවද දන්නෑ සිහියෙන් ඉන්නවට වඩා අසිහියෙන් නිර්වින්දනය වෙලා ඉන්න එක හොඳයි කියලා. කොහොමහරි පහුගිය දවසක පානදුර පැත්තේ තිබ්බ පාටියක දී කොල්ලො තුන් දෙනෙක්ම තමන්ගේ ජීවිතයෙන් වන්දි ගෙවුවෙත් මේ මත් උවදුරේ තවත් බිල්ලක් වෙමින් බවයි සරදියෙල්ට ආරංචි.

ලෝකයේ තිබෙන සමහර භයානකම මත්ද්‍රව්‍යයන් දැන් ලංකාවටත් ඇවිල්ලලු. රට ගොඩගන්න තියෙන තරුණ ජවය මත් පෙති අතරේ දිය කරලා දාන නරුම සමාජයක් තමයි මේ පාලකයෝ අපිට හදලා දීලා තියෙන්නේ.

තවත් වෙලාවක අපට මතකයි කෝට්ටේ පැත්තේ ඉස්කෝලෙකත් මත් පෙති ගෙනාපු ළමයෙක් teacher ගේ අතටම අහුවුණා. ඒත් ඒ සිද්ධිය යට ගැහුවා ඉස්කෝලේ කීර්තිනාමය රැකගන්න. තවත් ඉස්කෝලෙක හැම සතියෙම කොල්ලො දෙන්නෙක් තුන්දෙනෙක්ගෙ පංති තහනම් කරනවලු මත් පෙති ළඟ තියාගෙන අහුවෙලා.

ඉතිං මෙහෙව් රටක ඉස්කෝලෙ සිකියුරිටිව විතරක් අල්ලලා මේ වැඩේ නවත්තන්න පුළුවන් නම් මේ වසංගතය මෙලහකටත් නැවතිලා. සරදියෙල්ට හිතවත් නාකොටික් එකේ තරුණයෙක් කිව්වේ "ලංකාවට මත්ද්‍රව්‍ය එන ලින්ක් එක පහළ සිට උඩටම දන්නවා. පහළ උන් ඇල්ලුවට උඩ එවුන් අල්ලන්න බැහැ. උන් ඒ තරමටම බලවත් දේශපාලන හයියක් තියන් තමයි මේ ඔක්කොම කරන්නේ" කියලා.

ඉතිං කාට කියන්නද මේ දුක? system එකේ මුදුණටම හෙණ ගහලා තියෙද්දී සම්පූර්ණ system එකම මාරු නොකර, මේ උවදුර දුරු කරන්න බැහැ කියලා තමයි සරදියෙල්ට නම් හිතෙන්නේ.

නූතන සරදියෙල්

# නොදැනුවත්භාවය නිසා විනාශ වන අපේ ඛනිජ සම්පත



වසර 40ක් පැරණි නව ලිබරල් ආර්ථික ක්‍රියාවලිය තුළ පුත්තලම, නාත්තණ්ඩිය ප්‍රදේශයේ පිහිටා ඇති සිලිකා නිධියට හා වීදුරු කර්මාන්ත ශාලාවට අත්වී ඇති ඉරණම පිළිබඳව නැවත සලකා බැලිය යුතුය. ඒ මෙම නිධියත් වීදුරු කර්මාන්ත ශාලාවත් කලකට ඉහතදී අප රටට සම්පතක්ව පැවති නිසායි.

අප රටේ පිරිසිදු Sio2 හෙවත් සිලිකා, ස්වාභාවික පරිසරයේ දෙයාකාරයකට පවතී. එනම් ධමනි තිරුවානා හා සිලිකා වැලි ලෙසයි. ධමනි තිරුවානා ඉතා ඉහළ උෂ්ණත්ව හා පීඩන තත්ව යටතේ පාෂාණ විපර්තකරණය වීමෙන්, (අර්ධ හෝ පූර්ණ ලෙස ද්‍රව වන සිලිකා පාෂාණවල පැළුම් තුළම ධමනි ලෙස තැම්පත් වේ. මේවා ඉතා ඉහළ උෂ්ණත්ව වලදී ද්‍රව බවට පත්වීමත්, අවම ජල ප්‍රමාණයක් අඩංගු වීම නිසාත් ඉතා පිරිසිදුය. එහි ඇති Sio2 ප්‍රතිශතය 99.9% පමණ වේ. එමෙන්ම ප්‍රෙග්මටයිට්වල (පොළව මතුපිට ඇති සුදු පැහැති තිරිවානා කුට්ටි) විවිධ විශාලත්වයෙන් යුතු කුට්ටි ලෙසද තැන්පත්ව, ඇතැම් ප්‍රදේශවල (කුරුණෑගල, ඇඹිලිපිය, මාතලේ සහ වැල්ලවාය) සුදු පැහැ කුට්ටිද පොළවෙන් උඩට පැමිණ ඇති ආකාරය දැකිය හැක.

නාත්තන්ඩිය - මාදම්පේ ප්‍රදේශයේ සිට උතුරු අර්ධද්වීපය දක්වාම තැනින් තැන සුදු පැහැ වැලි නිධි ලෙස දැකිය හැක්කේ පිරිසිදු සිලිකා වැලිය. ඇතැම් විට 1-2m දක්වා උස් වූ කඳුවැටි, සුළං ධාරා මඟින් නිර්මාණය වී ඇත. පිරිපහදු කළ විට මෙහි සිලිකා Sio2 ප්‍රතිශතය 99%කට ආසන්නය.

ඉහත දෙයාකාරයේම තිරුවානා හෙවත් ක්වාට්ස්වල (Sio2) වූ භෞතික ගුණයන් විවිධ නිෂ්පාදන ක්‍රියාවලියන් වලදී උපයෝගී කර ගනී. එහි භෞතික ලක්ෂණ මත නිපදවන භාණ්ඩයේ ස්වාභාවය වෙනස් වේ.

පිරිසිදු තිරුවානාවල ඇති භෞතික ලක්ෂණය ලෙස පහත ඒවා හඳුනාගත හැකිය.

වර්ථනාංකය - 1.54

දැඩියාව - 7

වර්ණය - අවර්ණ, රෝස, කහ, දම් - (රෝස තිරුවානා, කහ ඇමතිස්ට්)

දීප්තිය - වීදුරුමය (vitrious)

තාප ප්‍රසාරණය - ඉතා අඩුය.

ඉතා හොඳ තාප අවශෝෂකයකි.

පීඩ විද්‍යුත් ගුණාංගයන් පෙන්වයි. (පීඩනයකට ලක් කළ විට විදුලිය ගමන් කරයි.)

මෙම පීඩ විද්‍යුත් ලක්ෂණ හේතුවෙන් තිරුවානා අර්ධ සන්නායක ලෙස භාවිතා වේ.

ද්‍රවාංකය- 1670 C°

රසායනය – Sio2

ලෝකයේ ඉතා පිරිසිදු තිරුවානාවල අර්ධ සන්නායක ගුණය භාවිතා කොට විශාල නිෂ්පාදන ප්‍රමාණයක් සිදු කර ඇත. මෙම ඉතා පිරිසිදු තිරුවානා electronic grade තිරුවානා ලෙස හඳුන්වයි. (99.9% පිරිසිදු) සූර්යාගෙන් පෘථිවියට ලැබෙන ශක්ති ප්‍රමාණය (ටෙට්‍රා වොට්) 174,000 (Tw) පමණ වේ. මෙයින් විදුලිබල නිෂ්පාදනයට යම් ප්‍රතිශතයක් දායක කළ හැකිය. ඒ සඳහා තිරුවානාවලින් නිෂ්පාදනය කරන සිලිකා ලෝහය ඉතා වැදගත්ය. ඒ සඳහාත් ඉතා පිරිසිදු (solour grade ) :99.99%) තිරුවානා අවශ්‍ය වේ. මෙම ඉතා පිරිසිදු තිරුවානා ලෝකයේ ඉතා දුලබය. ඉතාම පිරිසිදු සිලිකා ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රසිද්ධය. ඒ හෙයින් විවිධ අධිරාජ්‍යවාදී සමාගම් හා සංවිධාන අප රටේ තිරුවානා පිළිබඳව මහත් උනන්දුය.

මෙම ගුණාංග උපයෝගී කර ක්‍රි.පූ.4 වන සියවසේ දී පමණ වීදුරු භාණ්ඩ නිපදවීය. එතැන් සිට වර්තමානයේදී සිලිකා ලෝහය උපයෝගී කරගනිමින් සූර්ය පැනල, microchip, ආදිය නිපදවීම සිදුකෙරේ. එය ඉදිරියටද එසේම පවතිනු ඇත. එසේම ඉදිරියේදී තවත් වසර කිහිපයකින්, දශක කිහිපයකින් හෝ සියවසකින් සිලිකාවලින් නිපදවන භාණ්ඩ මොනවාදැයි අපට අනුමාන කළ නොහැක. නමුත් අද වනවිට මෙරට සිලිකා නිධිවලට අත්ව ඇති ඉරණම ඉතා ඛේදජනකය. එකී ඛේදජනක තත්වය අපට උරුම කරදී ඇත්තේ පවතින වැරදි සමාජ ආර්ථික ක්‍රියාවලිය විසින්ය යන්න පැහැදිලිය. තිරුවානා මඟින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල මිල කොපමණ ඉහළ ගියද අමුද්‍රව්‍යයේ මිල ඉතා අවමය.

1990 දශකයේ මුලදී ලංකාවට පැමිණි "රැක් ගාර්නට්" නැමති ලෝක බැංකු නියෝජිතයා 1992 අංක 33 දරණ ඛනිජ ද්‍රව්‍ය අපනයන පනත සම්පාදනය කොට දී ඇත. එමඟින් නිෂ්පාදන සමාගම්වලට ලංකාවෙන් තිරුවානා අපනයනය කරනු ලබනුයේ විවිධ වූ තැරව්කරුවන් හරහාය. ඔවුන් ඇමතිවරුන් හා රාජ්‍ය ආයතනවල නිලධාරීන් අදී පිරිස් වෙත අල්ලස් ලබා දෙමින් ඔවුනට අවශ්‍ය තිරුවානා අමුද්‍රව්‍යයක් ලෙසම කුණු කොල්ලයට ලබාගනී.

නාත්තණ්ඩිය, මාදම්පේ ප්‍රදේශවල ඇති සිලිකා වැලි අපනයනයට යම් සීමා පනවා තිබුණද මාතලේ, ඇඹිලිපිටිය වැනි ධමනි තිරුවානා නිධිවලට එසේ නොකිරීමට ඉතා සියුම්ව වග බලාගෙන ඇත්තේ මෙම 1992 අංක 33 දරණ පනත හරහාය.

අප රටේ පැවති එජාප හා ශ්‍රිලනිප ආණ්ඩු නාත්තණ්ඩිය වීදුරු කර්මාන්ත ශාලාව ඉන්දීය සමාගමකට විකුණා දමා ඇත. එමඟින් එම සමාගම සිලිකා වැලි මිලදී ගනු ලබනුයේ සාමාන්‍ය බොරළු පස්වලටත් වඩා අඩු මිලකටය. සිලිකා වැලිවල නියම වටිනාකම නොදත් පැවති ආණ්ඩුවල දේශපාලඥයින්ගේ හෙන්චයියන් විසින් සිලිකා වැලි ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා කැපීම සිදුකරයි. මහා පරිමාණයෙන් සිදුවන වැලි ජාවාරම හරහා විශාල වටිනාකමක් සහිත ඛණිජ වැලි විනාශ වී යමින් ඇත.

ඒ සඳහා දේශපාලන අධිකාරියේ අනුග්‍රහයද යහමින් ලැබේ. පවතින නීති කිසිවක් නොතකමින් සිදුකරන වැලි කැපීම් ඔස්සේ භූගත ජල සම්පත හා ජල මූලාශ්‍රද විනාශ කරයි. අමුද්‍රව්‍ය අවභාවිතාවෙන් සිදුවන පාරිසරික විනාශය මහා ජාතික අපරාධයකි. මෙම ජාතික අපරාධයට වගකිව යුත්තේ අප විසින් පත් කර ගනු ලබන පාලකයින් වන බැවින් අප කවුරුත් ගැඹුරින් ඒ පිළිබඳව සිතා බැලිය යුතුය.

## The Gadget

# ෆෝන් එකෙන් ON/OFF කළ හැකි ස්මාර්ට් බල්බයක්




Smart Home සංකල්පය යටතේ නිපදවූ Smart LED Bulb එකක් ගැන තමයි අද කතා කරන්නේ. මෙම ස්මාර්ට් බල්බය Xiaomi සමාගම විසින් හඳුන්වා දී තිබෙනවා.

මෙය නම්කර ඇත්තේ Xiaomi Yeelight යනුවෙනුයි. මෙහි විශේෂත්වය තමයි ස්මාර්ට් ෆෝන් එකක් මඟින් පාලනය කිරීමට ඇති හැකියාව. ඒ සඳහා පළමුව ඔබගේ ෆෝන් එකට Mi Home ඇප් එක ඉන්ස්ටෝල් කරගන්න. දැන් මෙම බල්බ් එක සමඟ connect වී ON/OFF කිරීමට, Colour change කිරීමට සහ Brightness adjust කිරීමටත් ඔබට පුළුවනි. මෙම බල්බය සඳහා වසර 11ක ආයුකාලයක් ඇති බව Xiaomi සමාගම පවසනවා. මෙය ඔබගේ නිදන කාමරයට වගේම ආලින්දයත් ඉතාමත් යෝග්‍යය බවයි පෙනෙන්නේ.

# කුණු කන්දෙන් මතුවන රත්‍රන්

රත්තරන් කියන්නේ ඈත අතීතයේ ඉඳලම ඉහළ ඉල්ලුමක් තියෙන ලෝහයක් බව අපි කවුරුත් දන්නවා. ඒ වගේම රත්තරන් ලබාගන්නේ පොළොවේ තියෙන නිධි මඟින් කියලත් දන්නවා. නමුත් අද අපි ඔබට කියන්නේ ඊට වෙනස්ම කථාවක්. අනාගතයේ දී රන් ආකර බවට පත්වෙන්නේ අහක දමන අපද්‍රව්‍ය යැයි කිව්වොත් ඔබ පුදුම වේවි.

රත්තරන් අපද්‍රව්‍ය සමඟ ස්වාභාවිකව සංයෝග නොවෙන බව අපි කවුරුත් දන්නවා. මේ නිසා රනින් හදපු දෙයක පැහැය සහ දිස්නය සදාකාලිකවම ආරක්ෂා වෙලා තියෙනවා.



රත්‍රංවලට තිබුණු අධික ඉල්ලුම නිසාම 1849 දී ඇමරිකාවේ කැලිෆෝනියාවේ දී මෙන්ම 1886 දී දකුණු ඇමරිකාවේ ජොහැනස්බර්ග් හිදීත් රන් සොයාගැනීම නිසා, සුවිසල් නගර පවා බිහිවුණා. ලංකාවේත් ඕනෑම තැනක ඇති පස් ටොන් එකක් තුළ මිලි ගෑම් 5ක පමණ රත්‍රං ප්‍රමාණයක් අඩංගු වෙනවා. නමුත් එය නිස්සාරණය කිරීම ආර්ථිකයට ලාභදායී වන්නේ නැහැ. අද වන විට ආකරවලින් රන් ලබාගැනීම අධික වියදම් සහිත සහ ලාභය අඩු ක්‍රියාවලියක් බවට පත්වෙලා. රන් ආකරවල ලෝපස් ටොන් එකකට රත්‍රං ග්‍රෑම් 10ක් තියෙන්නෙත් හරිම කලාතුරකින්. බොහෝ විට එය ග්‍රෑම් 3ත් 8ත් අතර අගයක් වෙනවා.

රත්‍රංවල ඇති සන්නායක ගුණය සහ කල්පැවැත්ම නිසා ඉලෙක්ට්‍රොනික පරිපථවලටත් එය නැතිවම බැහැ. මේ නිසා අපි පාවිච්චි කරළා ඉවත දමන ඉලෙක්ට්‍රොනික උපාංග බොහෝමයක රත්‍රං සුවිශාල ප්‍රමාණයක් අඩංගු වෙනවා. ඉවත දාපු ෆෝන්, පරිගණක, රූපවාහිනී, DVD ප්ලේයර් වගේ උපාංග ටොන් එකක් තුළ රත්‍රං ග්‍රෑම් 30ත් 300ත් අතර ප්‍රමාණයක් අඩංගු වෙන්න පුළුවන්. ඉතින් ප්‍රාග්ධන වියදම් ඉතිරිය නොසලකා හැරියත් රන් ආකරයක වගේ 5 ගුණයකටත් වඩා ලාභදායකයි. මේ නිසා අනාගතයේ දී ඉලෙක්ට්‍රොනික උපාංග ප්‍රතිචක්‍රීකරණය කියලා කියන්නේ රත්‍රං නිස්සාරණය කරන ප්‍රධානම ක්‍රමය වෙන්න පුළුවන්. සමහර රටවල දැනටමත් මේ ක්‍රමය ආරම්භ කරලායි තියෙන්නේ.



## Sports

# ඔලිම්පික් ඉතිහාසයේ විශිෂ්ටතම පරාජිතයා

1964 වසරේ ඔලිම්පික් උළෙල ජපානයේ ටෝකියෝ නුවර දී පැවැත්වීය. මෙහි මීටර් දස දහස තරඟයට කාගේත් අවධානය යොමු විය. තරඟය ආරම්භ වූයේ විනිසුරුගේ සංඥාවත් සමඟය. මේ තරඟයට අපේ රට නියෝජනය කරමින්, ඒ වන විට 'සිලෝන්' රට නියෝජනය කරමින් ආර්. කරුණානන්ද සහභාගී විය.



තරඟය ආරම්භ වී ටික වේලාවක් යන විට කරුණානන්දව පසු කරමින් සියලු ක්‍රීඩකයින් ඉදිරියටම ඇදුණි. කරුණානන්ද සිටියේ වටයක් පිටුපසිනි. පළමු වට දහය අවසන් වන විට ඔහුගේ පසුබෑම වට හතරක් විය. 20 වන වටය නිමවන විට කරුණානන්ද අන්තිමයා විය. තරඟය අවසන් කරමින් ඇමරිකානු ක්‍රීඩක බිලී මිල්ස් පළමු ස්ථානයට ද, දෙවන හා තෙවන ස්ථාන සඳහා පිළිවෙළින් ටියුනීසියානු හා ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයින්ද තෝරාගනු ලැබූහ. බොහෝ ක්‍රීඩකයින් තරඟය නතර කර දැමුවේ තවදුරටත් දිවීමෙන් ඵලක් නොවන නිසා හා ජයග්‍රාහකයින් තෝරාගෙන අවසන් නිසාය.


මේ වන විට කරුණානන්ද සිටියේ වට 4ක් පිටුපසිනි. එනම් මීටර් එක්දහස් හයසීයක් පිටුපසිනි. එහෙත් කරුණානන්ද නතර වූයේ නැත. පළමු මීටර් හාරසියය දුවද්දී කරුණානන්ද හට ක්‍රීඩාලෝලීහු සමච්චලයට උසුළු විසුළු කිරීමට පටන් ගත්හ. දෙවන මීටර් හාරසියය යන විට තැනින් තැනින් අත්පොළසන් එකින් එක ඇහෙන්නට ගත්තේය. තුන්වන මීටර් හාරසියය දුවද්දී සියලු දෙනාම අත්පොළසන් දෙන්නට පටන් ගත්තේ මේ ධෛර්යවන්ත මිනිසා වෙනුවෙනි. අපේ කරුණානන්ද තරඟය නිමා කළේ හැටදහසක් පමණ වූ ක්‍රීඩාලෝලීන්ගේ අත්පොළසන් සහ ආචාර මධ්‍යයේ ඔලිම්පික් ඉතිහාසයේ විශිෂ්ටතම පරාජිතයා ලෙසිනි.


ලංකාවේ හිටපු ක්‍රීඩා ඇමතිවරයෙක් වූ වී. පී. සුගතපාල මහතා වරක් ප්‍රකාශ කර තිබුණේ "ඩොලර් දස දහසකින්වත් ලබා ගත නොහැකි ගෞරවයක් මේ පුංචි ක්‍රීඩකයා ලබා දුන් බවයි."

කරුණානන්ද කියා තිබුණේ "මට ඕන වුණේ තරඟය ආරම්භ කරන්න විතරක් නෙවෙයි. අවසන් කරන්නත්!"

කරුණානන්ද එදා ජපානයේ ටෝකියෝ නුවර සිට ලෝකයට කියා දුන් ධෛර්යවන්ත මිනිසාගේ පාඩම අද ජපාන පෙළ පොතේ 05 ශ්‍රේණියේ පළමු පාඩමේ "ධෛර්යවන්ත මිනිසා" ලෙස සඳහන් වේ.

ඉඳින් ජපානයට පමණක් නොව, අපටද කරුණානන්දගෙන්, මේ ධෛර්යවන්ත මිනිසාගෙන් උගත යුතු දෑ බොහෝයි.





# ආසියානු දැල් පන්දු ශූරතාවය ලංකාවට



පසුගියදා පැවැති 2018 ආසියානු දැල් පන්දු තරඟාවලියේ ශූරතාවය හිමි කරගැනීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් විය. සිංගප්පූරු කණ්ඩායම සමඟ පැවති අවසන් මහා තරඟයේදී ලකුණු 69 ට 50 ක් ලෙස විශිෂ්ට ජයක් වාර්තා කිරීමට ශ්‍රී ලංකා ක්‍රීඩිකාවන්ට හැකි විය. ආසියානු දැල්පන්දු තරඟාවලියේ අපරාජිත කණ්ඩායම ලෙස තරඟ බිමට පිවිසි ශ්‍රී ලංකා පිළ ශූරතාවය ඉසිලීමත් සමඟ ලබන වසරේ එංගලන්තයේ ලිවර්පූල් හි පැවැත්වීමට නියමිත ලෝක ශූරතා දැල් පන්දු තරඟාවලිය සඳහා ද සුදුසුකම් ලැබීමට සමත් විය.

# කැරම් ලෝක කුසලානය පළමු වරට ශ්‍රී ලංකාවට



කොරියාවේ චුන්චෝන් හිදී පසුගියදා අවසන් වූ පස්වැනි කැරම් ලෝක කුසලාන තරගාවලියේ දී පිරිමි ශූරතාවය හා කාන්තා අනුශූරතාවය හිමි කර ගැනීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් විය. අගෝස්තු මස 26 දින මෙහි අවසන් තරඟය පැවතුණි.

චමිල් කුරේ, නිෂාන්ත ප්‍රනාන්දු, මොහොමඩ් ශෆීඩ් සහ උදේෂ් ශෂික ශ්‍රී ලංකා පිරිමි කණ්ඩායම නියෝජනය කළහ. යෂිකා රාහුබැද්ද , ජොසප් රොෂිටා, චලනි ලියනගේ සහ මධූෂා රාමනායක ශ්‍රී ලංකා කාන්තා කණ්ඩායම නියෝජනය කළහ.

මෙම තරඟාවලියට රටවල් 20ක් සහභාගී වූ අතර මේ වසරේදී කැරම් ශ්‍රේණිගත කිරීම්වල අංක 01 ස්ථානය හිමිව තිබුණේ ශ්‍රී ලංකාවටය.

# රුසියාවෙන් ෆ්‍රී කික් එකක්



රුසියාව විසින් සත්කාරකත්වය හෙබවූ මෙවර ලෝක කුසලාන තරඟාවලියේ නැරඹූ විදේශික ප්‍රේක්ෂකයන් හට 2018 වසර නිමා වන තෙක් වීසා රහිතව රුසියාවට නැවත පැමිණීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන බව රුසියානු ආණ්ඩුව පවසයි. මොස්කව් නුවර, ලුස්නිකි ක්‍රීඩාංගණයේ පැවති අවසන් මහා තරඟය නිමා වීමෙන් පසුව ඔවුන් මේ බව ප්‍රකාශයට පත්කර ඇත. මෙවර පාපන්දු ලෝක කුසලාන තරඟාවලියේ ප්‍රේක්ෂකයන් විසින් සිය ප්‍රවේශ පත්‍ර මිලදී ගන්නා අවස්ථාවේදී ඒ සමඟ හැඳුනුම්පතක් ද නිකුත් කිරීමට රුසියානු බලධාරීන් කටයුතු කර තිබුණි. ඒ අනුව එම හැඳුනුම්පත් හිමි විදේශික පාපන්දු ලෝලීන් සියලු දෙනාටම මේ වසර අවසානය දක්වා වීසා රහිතව රුසියාවට පැමිණීමේ අවස්ථාව හිමි වේ.

# ශ්‍රී ලංකා කබඩි පසුබෑසී



ආසියානු ක්‍රීඩා උළෙලේ කබඩි ඉසව්වෙන් ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැක්වූ පසුබෑම නිසා කබඩි සම්මේලනයේ සභාපති ඒ. ඩී. පතිරණ මහතා එම ධූරයෙන් ඉල්ලා අස්වී තිබේ. ඔහු එම ඉල්ලා අස්වීමේ ලිපිය ක්‍රීඩා අමාත්‍යවරයා වෙත යොමුකර තිබූ බව මාධ්‍යය වාර්තා කර තිබුණි.
18 වන ආසියානු ක්‍රීඩා උළෙලේ කබඩි තරඟයේ කාන්තා සහ පිරිමි ඉසව් තුළින් පදක්කම් බලාපොරොත්තු තිබුණද ශ්‍රී ලංකා කාන්තා කබඩි කණ්ඩායමට ජයගත හැකි වූයේ සහභාගී වූ තරඟ 04න් 02ක් පමණී. ශ්‍රී ලංකා පිරිමි කබඩි කණ්ඩායමට ද ජයග්‍රහණය කළ හැකි වූයේ එක් තරඟයක් පමණි.

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය
*FORWARD කවිපිටුව,*
*අංක 464/20, පන්නිපිටිය පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල.*

## ලංගමේ ජංගමේ


උඹෙ බැල්ම ජංගමය
කොහොමටත් ලංගමය
ටිකට් නැති ආදරය
මගින් බැස යා යුතුය
අන්තිම ශීට්වල හාදු
කළුය ලිස්සන සුළුය
බසයට රෝදයට ඕන
හැටියටම පෙම්බරය
ඇස්වලින් මස් යදින
ජැක්සන්ලා සිල්වත් ය
ලංගමේ ජංගමේ
නොකිව්වට රසවත් ය
අතකින් ඇගේ බත
අතකින් උඹේ අත
උරයේ ලියාපං දෙතොලින්
සෙනෙහෙ කව
පස්සට ඉස්සරහට දුව දුව
බහින දොර
හොයනා දහක් උන් මැද
ආදම් ය මම
තෙරපුම යටිකුරුය
පසිඳුරන් කුප්පන සුළු ය
පා පුවරු අවදානම් ය
යාම නීතියෙන් වුව තහනම් ය
ප්‍රම්ලෝ... මේ ඇස් පෙට්ලල්
වහා ගිනි ඇවිලෙන සුළුය
දෙදෙන නැවතුම් දෙකෙන්
අදත් බැස යා යුතුය...

] **දීපිකා පෙරේරා** - FB **ඇසුරෙන්** [

## ණය...

උපන් මේ මව් බිමට
සත පහක ණය නැලු
උඹ හරිම ලොකු කමෙන්
පුරාජේරු දොඩනවා..
ඇවිත් උන් කළුවරෙන්
වටින හැම සම්පතම
විකුණමින් ලෝකයට
තව ජෝගි නටනවා..
තවත් උන් මහ පාරේ
රැයක් දවාලක් නැතිව
ලේ කඳුළු වගුරමින්
අපේ උන් රකිනවා..
නූපන් කලලයත්
ලෝකෙටම ණය කරපු
ඒ පට්ට හොරු රැළම
අපෙ උන්ට වටිනවා..

] **හිරුමාලි දිසානායක - අනුරාධපුරය** [



## තේ දල්ලක කූඩැල්ලෙකුගේ කඳුළු

හැපුවාට පුරුද්දට
එල්ලීගෙන තදට
චූෂකර තෙරපාම
ඔය පා නහර මැදට...
තිබුණා ලේවල රසක්
නැති වගට හිතුවෙ මම
තාම රෑ කෑ රොටිය
කහට විතරද බඩට...
පාට නෑ තද පාට
හිමොග්ලොබින් අඩුව
ෆෙරස්, ෆෝලික් ගන්න
ක්ලිනික් යනවා නේද..?
සමාවෙන් අම්මෙ මට
නොදැන බිවු ලේ බිඳට
උන් වගෙම - මමත් උඹෙ
ලේ උරා බිව් පවට...

] **දිනූෂ පරණවිතාන - හම්බන්තොට** [

## මේක අපේ රට

දිවා රෑ හීනයට
හීනයක් තොල ගාන
මහමෙරට බෝරයක්
ගහන්නට දින ගණින
ඇඳි වතට නිගා කොට
මුනිවතින් සිල් රකින
දනන් මෙහි බොහෝ වෙති
විහිළුවෙන් දිවි ගෙවන
සුරුවමට වැඳගෙන
සුපින්වත් බෝසත්තු
ඇති පදං මජරකං
කරයි මේ බලවත්තු
කහවතින් මුනිවතින්
රකින හැටි මේ පුත්තු
රෙදි නැත්තේ අපිට බව
දන්නවා ඒ සත්තු
තට්ටු හීන මාළිගාව
ඔලුවෙ කැරකෙනා
වෙට්ටු දමා රජ වෙන්නට
මාන බලමිනා
මට්ටු වෙලා මදි ඇති
මේ දනන්ට ඉතිනා
රට්ටු එකෙක්වත්
සිටි නම් අතක් ඔසවනා

] **සම්පත් මිහිරගේ - හම්බන්තොට** [

## බිතුසිතුවම්

සීගිරි ගලේ කෙටුවේ අප්සරා රුව
පෙන්වීමටයි ලියකගෙ ඇති සොඳුරු බව
ඇත් රැජිණියක් ඒ අසලට ඇවිත් තව
සීගිරි ගල වටේ අල්ලයි සෙමින් ඉව

] **ගාමිණී දිසානායක - අනුරාධපුරය** [

## කැට සල්ලි

දියවන්නා ගාලේ සරන මැතිඳාන
ඇවිත් බලනු මැන පාරට ඇවිදාන
ඒ සී රියේ නැග යන විට නොපෙනේන
කැටේ ඇත්තෙ අපෙ මිනිසුන්ගෙම හීන

] **මධුශාන්ත ඇඹිලිපිටිය** - FB **ඇසුරෙන්** [

# කලාකරුවාට මිලක් වෙනුවට වටිනාකමක් තිබිය යුතුයි



ඉෂාර වික්‍රමසිංහ

## ඔබව හඳුන්වා දෙන්න කැමති කොහොමද?

මම ඉෂාර වික්‍රමසිංහ. නිදහස් කලාකරුවෙක් ලෙස හඳුන්වා දෙන්න කැමතියි.

## කලාව තුළ ඔබ මෙතෙක් පැමිණි ගමන ගැන සඳහන් කරන්නේ නම්?

මම 1999 දී තමයි මුලින්ම කලා නිර්මාණයකට දායක වෙන්නේ. පාසැල් සිසුවෙකු ලෙස 06 වසරේ ඉන්නා විට මගේ හැකියාවන් දැකපු මගේ සංගීත ගුරුතුමිය වුණු රත්නා ලාලනී ගුරුතුමිය මාව ජයලත් මනෝරත්නයන්ට හඳුන්වා දුන්නා, මේ හඳුන්වා දීම හරහා එතුමාගේ තලමල පිපිලා නාට්‍ය හා සම්බන්ධ වීමට හැකියාව ලැබෙනවා. ඊට පසුව මම ප්‍රවීණ හා දක්ෂ නිර්මාණ ශිල්පීන් යටතේ වේදිකා නාට්‍ය ගණනාවක හා චිත්‍රපටවල, නාට්‍ය හඬකැවීමේ ශිල්පියෙකු ලෙසත් කටයුතු කළා.ඒ වගේම මම දැනට වෘත්තියෙන් කැළණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංග කලා පිළිබඳ කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කරනවා.

## ලංකාවේ කලාව ගැන ඔබට යම් අදහසක් ඇති. ඒ ගැනත් සඳහන් කළහොත්?

කලාවට සක්‍රීය ලෙස දායක වන අපේ රටේ කලාව ලෝකය ඉදිරියට රැගෙන යාමට අපමණ වෙහෙසක් දරන කලා නිර්මාණකරුවන් පිරිසක් අපට ඉන්නවා. හැබැයි ප්‍රේක්ෂකයාගේ පැත්තෙන් දක්නට ලැබෙන්නේ එන්න එන්නම රසවින්දනය මොට වීමක්. ඊළඟට සඳහන් කළ යුතුයි මේ රට පාලනය කරන, එමෙන්ම කලාව භාරව ඉන්න පාලකයින් පවා කලාවට කරන සේවාවක් නොමැති තරම් බව. ඔවුන් කලා නිර්මාණයක හරය ගැන කිසිඳු අධ්‍යනයකින් තොරව මතුපිටින් පමණක් බලා වාරණය කිරීම හොඳ කලා නිර්මාණ බිහිවීමට ප්‍රබල බාධාවක්.

## විශේෂයෙන්ම අද වන විට බොහෝ කලා නිර්මාණ දක්නට ලැබෙන්නේ කොළඹ කේන්ද්‍ර කරගෙනයි. මේ ගැන ඔබගේ අදහස?

මම මේකට නාට්‍ය දෙබසකින්ම උත්තර දෙන්නම්. "කොළඹ තියෙන්නේ ලංකාව ඇතුළේ වුනාට ලංකාව තියෙන්නේ කොළඹ ඇතුළේ" ඒ වගේම මෙය මේ කලා ක්ෂේත්‍රයේ පැවැත්ම ගැනත් සඳහන් කිරීමක්. විශේෂයෙන්ම ගම තුළින් කලාකරුවෙක් බිහි වුනොත් ඔහුට ස්ථාවර වීම සඳහා කොළඹට සංක්‍රමණය වෙන්න සිදු වෙනවා. ගම ගත්තොත් ගම තුළ නාට්‍ය පෙන්වීමට රංග ශාලා නෑ. බොහෝ විට ප්‍රජාශාලාවල තමයි පෙන්වන්නේ. ප්‍රේක්ෂකයාට ඉඳගන්න තිබෙන්නේ බංකු. චිත්‍රපට ශාලාවන් පවා නවීන පහසුකම් හා තාක්ෂණය යොදාගැනීම අතින් දුර්වලයි. ඒ වගේම තමයි ග්‍රාමීය සමාජය තුළ තිබෙන ආර්ථික අපහසුව නිසා ඔවුන් හොඳ වේදිකා නාට්‍යයක් බලන්න මුදල් වියදම් කරනවා අඩුයි. ඒ වෙනුවට ඔවුන්ට එම මුදලින් කළ යුතු වැඩ ගොඩක් තිබෙන බැවින් ඔවුන් හොඳ නාට්‍යයක් රස විඳීම මඟ හරිනවා. ඒ වගේම ගම තුළින් කලා නිර්මාණකරුවන් බිහිකරවීමට අවශ්‍ය වැඩපිළිවෙළක් රජයට නෑ. හැබැයි සමාජවාදී කලා සංගමය එයට මෑතක සිට මැදිහත් වෙමින් සිටිනවා.

> "කොළඹ තියෙන්නේ ලංකාව ඇතුළේ වුනාට ලංකාව තියෙන්නේ කොළඹ ඇතුළේ"

## අද වන විට බාල ඝනයේ හා විශේෂයෙන්ම ජාතිවාදී ස්වරූපයේ ටෙලිනාට්‍ය විකාශනය වෙනවා දක්නට පුළුවන්. ඒ ගැන ඔබගේ අදහස?

ජයලත් මනෝරත්නයන්ගේ නාට්‍යයක තිබෙනවා මෙහෙම. "පුන්නක්කු ඉල්ලන විට බත් දීලා හරියන්නෑ" කියලා. බොහෝ නාලිකා විසින් ඉල්ලුමට සරිලන සැපයුම ලබාදීම තුළින් තමයි මෙම අවර ඝනයේ හා ජාතිවාදී ප්‍රවණතා සහිත නාට්‍ය විකාශනය වෙන්නේ. සමාජයේ ලේ ජාතිවාදයෙන් රත් වී තිබෙන මොහොතේ එවැනි නාලිකාවලින් තමන්ගේ ලාභ පංගුව වැඩි කරගනිමින් ඉන්නවා. ඒ නිසයි මිනිසුන්ගේ දැනුවත්භාවය අවශ්‍ය වන්නේ.

## කලාකරුවා මුදලට විකිණිය යුතුද?

කිසිසේත්ම නෑ. හැබැයි කලාකරුවාට මිලක් වෙනුවට වටිනාකමක් තිබිය යුතුයි. බොහෝ කලාකරුවන් ඉන්නවා, ඔවුන්ගේ වෘත්තීය වන්නේ කලාවයි. හැබැයි ඔවුන්ට ජීවත් වීම සඳහා කලාව උපයෝගී කරගන්න වෙනවා. ඒ නිසා කලාකරුවා තමාගේ කලා භාවිතාව ඉතාම සදාචාර සම්පන්නව යොදාගත යුතුයි.

## කලාව තුළින් සමාජ පෙරළියක් කළ හැකිද?

පුළුවන්, අතීතයේ ඉඳලම ඒකට උදාහරණ තියෙනවා. එයයි කලාව ආනන්දයෙන් ප්‍රඥාවට ගෙනයනවා කියන්නේ. කලාකරුවා තමාගේ ආත්ම ප්‍රකාශ සමාජගත කිරීමේ දී සමාජ ප්‍රගමනය ඉලක්කගත කළ යුතුයි.

## ඔබට ලැබුණු සම්මාන ගැනත් සඳහන් කරනවා නම්?

2004 රාජ්‍ය ටෙලි සම්මාන උළෙලේ හොඳම ළමා නළුවාට නිර්දේශ වුනා. 2015 දී යෞවන සම්මාන උළෙලේ හොඳම නළුවාට හිමි සම්මානය ලැබුණා. 2016 දී සරසවි සම්මාන උළෙලේ හොඳම නවක නළුවාට හිමි සම්මානය ලැබුණා. 2016 දී නාට්‍ය සඳහා රාජ්‍ය නාට්‍ය උළෙලේ කුසලතා සම්මානයක් ලැබුණා. මෙම සම්මාන වගේම මට වඩාත් වටිනා ජනතා සම්මාන නිරන්තරයෙන්ම ලැබෙනවා.

## ඔබට මේ රටේ තාරුණ්‍යයට ලබාදීමට පණිවිඩයක් තිබෙනවාද?

කලාවට ආදරය කරන්න. කලාව එක්ක ඉන්න. හොඳ නිර්මාණ රසවිඳින්න. ඔබත් හොඳ නිර්මාණකරුවෙක් වෙන්න. ඔබ නියැලෙන කුමන ක්ෂේත්‍රයෙන් හරි සමාජ පෙරළියක් සඳහා දායක වෙන්න.



# අප ජීවත් වී සිටින්නේ අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රහාරයන් වඩාත් තීව්‍ර කරමින් සිටින මොහොතකයි

*ලෝක තරුණ හා ශිෂ්‍ය සම්මේලනයේ සභාපති යාකොවොස් ටොෆාරි සහෝදරයා සමග කළ සංවාදය*



**ඔබ නියෝජනය කරන සංවිධානය පිළිබඳ තොරතුරු මොනවාද?**

මම හිතන්නේ මුලින්ම මගේ රට ගැන දේශපාලන හැඳින්වීමක් නොකර මම නියෝජනය කරන සංවිධානය ගැන කියන්න අමාරුයි. මොකද, මගේ සංවිධානය වන EDON හි සමස්ත ස්වරූපය ගොඩනැගීමට මගේ රට වන සයිප්‍රසයේ සුවිශේෂී තත්වයන් ඉවහල් වූ නිසායි. සයිප්‍රසය යනු මධ්‍යධරණී මුහුදේ තුර්කිය, ග්‍රීසිය හා මැදපෙරදිගට සමීපව පිහිටා ඇති කුඩා දූපතක්. ශතවර්ෂ ගණනාවක් පුරාවටම සයිප්‍රසයේ මෙම පිහිටීම සුවිශේෂී තත්වයක් ඇති කරනු ලැබුවා. එමෙන්ම සයිප්‍රසයේ සංස්කෘතිය යනු මෙම කලාපයේ සියලු සංස්කෘතිවල මිශ්‍රණයක්. 19 වන ශතවර්ෂයේදී අධිරාජ්‍යවාදීන් විසින් මෙම සංස්කෘතික වෙනස්කම් උපයෝගී කරගනිමින් අපගේ භූමියත් එහි වෙසෙන ජනතාවත් බෙදා වෙන්කිරීමට උත්සාහ කරනු ලැබුවා.

පසුගිය ශතවර්ෂ 05 ක් පුරාවටම සයිප්‍රසයේ ජනගහනය සමන්විත වූයේ ප්‍රධාන ජනවර්ග 02කින්. ඒ ග්‍රීක් - සිප්‍රියෝට්ස් සහ ටර්කිස් සිප්‍රියෝට්ස් (Greek cypriots - Turkish cypriots) යන ජන වර්ග ලෙසයි. ඔටෝමාන් අධිරාජ්‍යවරුන් විසින් 1878 දී සයිප්‍රසය බ්‍රිතාන්‍යයන්ට විකුණා දැමීමෙන් පසු එය බ්‍රිතාන්‍යයේ කොළනියක් බවට පත්වූවා.

බ්‍රිතාන්‍යයන් විසින් ජාතිකවාදය උත්සන්න කරමින් මෙම ජනවර්ග 02 එකිනෙකට විරුද්ධව කටයුතු කරන තත්වයට පත්වීමට සැලැස්වූවා. එයට හේතුව ලෙස දැක්විය හැක්කේ 19 වන ශතවර්ෂයේ මුල් භාගයේ දී ඉතාමත් වේගයෙන් වර්ධනය වෙමින් පැවති වැඩකරන ජනතාවගේ නැගීසිටීමයි.

අධිරාජ්‍යවාදීන් විසින් ජාතිකවාදය භාවිතා කරමින් රට බෙදීමට කටයුතු සැලැස්වූවා. අවසානයේ 1974 දී තුර්කිය විසින් සයිප්‍රසය ආක්‍රමණය කිරීම දක්වා මෙය උත්සන්න වූවා.

EDON පිහිටුවීමේදීත් මෙම නොවිසඳුණු බරපතල ගැටලුව තිබුණා. මේ වන විට අප සංවිධානයේ මූලික අරමුණක් වන්නේ මෙම බලහත්කාර අත්පත් කරගැනීම නතර කරගැනීම මෙන්ම අපගේ භූමිය හා ජනතාව නැවත එකතු කිරීමයි.

**අපි දන්නවා WFDY යනු ලොව විශාලතම අධිරාජ්‍ය විරෝධී තරුණ සංවිධානයයි. එහි සභාපතිවරයා ලෙස මොනවාද ඔබට පැවරෙන වගකීම් ?**

ලොකුම වගකීම වන්නේ සංවිධානය භාරගන්නා විට තිබුණු තත්වයට වඩා ඉතාමත් ශක්තිමත් ආකාරයට එය සකස් කිරීමයි. ඒ වගේම 21 වන ශතවර්ෂයේ අභියෝගවලට මුහුණ දිය හැකි සංවිධානයක් නිර්මාණය කිරීමයි. එය සභාපතිවරයාගේ දායකත්වයෙන් පමණක් සිදු කළ හැක්කක් නොවෙයි. එය රඳා පවතින්නේ සංවිධානයේ සියලු සාමාජිකයින්ගේ, විශේෂයෙන්ම මූලස්ථාන හා මහා සභාවේ කාර්යභාරයෙනුයි.

**WFDY මුහුණ දෙන අභියෝග මොනවාද ?**

WFDY මුහුණ දෙන අභියෝග කියලා කියන්නෙත් ලොව සියලු තාරුණ්‍යය මුහුණ දෙන අභියෝගම මිසක් අන් කවරක්වත් නොවෙයි. දෙවන ලෝක යුද්ධ කාලයෙන් පසු දුෂ්කරම කාලයට තමයි අද තරුණයා මුහුණ දී සිටින්නේ. ක්‍රමයේ ගැඹුරු අර්බුදය විසින් මිනිසාගේ ජීවන රටාවේ සමතුලිතතාවය දශක ගණනාවක් තිස්සේ බිඳ දැමීම නිසා තරුණයින්ට තවත් අලුත් ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා.

අර්බුද විසඳීමට ගන්නා මර්දනකාරී "විසඳුම්" හමුවේ මෙම ප්‍රශ්න තව තවත් උත්සන්න වී තිබෙන්නේ කිසිම ධනපති රාජ්‍යයකට විසඳීමට නොහැකි අයුරිනුයි. හොඳම නිදසුන තමයි පසුගිය වර්ෂ කිහිපය තුළ සමහර රටවල්වල ෆැසිස්ට්වාදී කණ්ඩායම් සීඝ්‍ර ලෙස නැගී ඒම.

අද තිබෙන විශාලම අභියෝගය තමයි, මේ සියලු ගැටලු එකිනෙකට බැඳී ඇති බව පහදා දීම. අපි හිතන්නේ නෑ, එක් රටක අසමත්කම ඇති වන්නේ දූෂිත දේශපාලකයින් නිසාත්, තවත් රටකට සාපේක්ෂව හොඳ තත්වයක් තිබෙන්නේ මහන්සි වී වැඩකිරීම හෝ බුද්ධිමත්බව නිසාත් යනුවෙන්. නමුත් අපි හිතන්නෙ මේ සියලු අර්බුද එකම මූලධාර්මික අර්බුදයක පැතිකඩයන් කියලයි. එනම් අධිරාජ්‍යවාදයයි. පැහැදිලි ලෙසම සෑම රටක්ම එකම තීව්‍රතාවයකින් මෙම අර්බුදයට මුහුණ දීමක් සිදුවන්නේ නැහැ. එම නිසා අපගේ ප්‍රතිචාරයන් ප්‍රශ්නයේ ස්වභාවය අනුව වෙනස් කරගත යුතුයි.

12 පිටුවට

## ඇමරිකාවට ඉන්දියාවෙනුත් බදු



ඇමරිකා එක්සත් ජනපදයේ සිට ඉන්දියාවට ආනයනය කෙරෙන භාණ්ඩ සඳහා තීරු බදු පැනවීමට ඉන්දියාව තීරණය කර ඇත. මෙම භාණ්ඩ අතර ආමන්ඩ්, වෝල්නට් සහ ඇපල් ඇතුළු භාණ්ඩ ඇති බව වාර්තා වේ.

ඇමරිකානු ජනාධිපතිවරයාගේ ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය යටතේ චීනය, යුරෝපා සංගමය ඇතුළු බොහෝ රාජ්‍යයන්ගේ සිට පැමිණෙන භාණ්ඩ සඳහා තීරුබදු පැනවීමට කටයුතු යොදා ඇත. ඊට එකට එක කිරීමක් වශයෙන් මෙම රාජ්‍යයන් ඇමරිකා එක්සත් ජනපදයෙන් පැමිණෙන භාණ්ඩ සඳහා මෙලෙස බදු පනවා ඇත.


## සෞදියේ කැනඩා තානාපති පිටුවහල් කෙරේ



සෞදියේ අරාබියේ කැනඩා තානාපති ඩෙනිස් හොරාක් එරටින් පිටුවහල් කිරීමට සෞදි බලධාරීන් පසුගියදා පියවර ගෙන ඇත. ඒ සමගම කැනඩාවේ සිටින සිය සෞදි තානාපතිවරයා මව්බිමට කැඳවීමටත් කැනඩාව සමඟ පවතින වෙළඳ සහ ආයෝජන කටයුතු අත්හිටුවීමටත් තීරණය කර තිබේ.

පසුගිය සතියේ සෞදි අරාබියේදී අත්අඩංගුවට පත් වූ සමාජ ක්‍රියාකාරීන් පිරිසක් වහාම නිදහස් කළ යුතු බවට කැනඩාව විසින් සිදුකළ අදහස් දැක්වීමකට ප්‍රතිචාර ලෙස මෙලෙස සෞදිය කටයුතු කර ඇත. සිය රටෙහි අභ්‍යන්තර කටයුතුවලට කැනඩාව සිදුකළ ඇඟිලි ගැසීම්වලට එරෙහිව මෙම තීරණය ගත් බව එරට රජය පවසා සිටී.

## දේශගුණික විපර්යාස හේතුවෙන් ස්වභාවික ආපදා දරුණු වෙලා



පසුගිය කාලය පුරාම ලෝකයේ ඇති වූ ලැව්ගිනි, හදිසි ගංවතුර ආදී ස්වභාවික ආපදා සියල්ලටම හේතුව දේශගුණික විපර්යාස බව දේශගුණික විද්‍යාඥයෝ පවසති.

ඒ අනුව ආසන්න සති කිහිපය පුරාම ජපානයේ ඇති වූ ගංවතුර හා උණුසුම් සුළං ධාරා, ස්වීඩනයේ සහ ග්‍රීසියේ ඇති වූ ලැව්ගිනි සහ ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ හටගෙන ඇති ලැව්ගිනි ආදී සියල්ලටමද එම දේශගුණික විපර්යාස බල පෑ බව එම විද්‍යාඥයින් විසින් වැඩිදුරටත් අවධාරණය කර ඇත.

මිනිසා විසින් සිදුකරන ක්‍රියාකාරකම් නිසා උණුසුම් වායූන් විශාල ප්‍රමාණයක් බිහිවීම මෙලෙස ලෝකය උණුසුම් වීමට හේතු වී තිබේ. එසේම උතුරු අර්ධ ගෝලයේ කාලගුණික තත්වයේ පාලකයා වන සුළං ප්‍රවාහවල අසාමාන්‍ය හැසිරීමත් මෙම විනාශයන් සඳහා හේතුවන බවද වාර්තා වේ.

## අසාධාරණ බදුවලට එරෙහිව රුමේනියානුවන් වීදි බසිති



රජය විසින් අධික ලෙස බදු අය කිරීම, විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ මෙන්ම යුරෝපා සංගමය සහ නේටෝ සංවිධානය සමඟ පැවති සබඳතා අතහැරීම ආදී කරුණු මුල්කරගත් රුමේනියානුවෝ 50,000කට අධික පිරිසක් එරට බුකරෙස්ට් නුවර වික්ටරි චතුරශ්‍රයට රැස්ව දැවැන්ත රැලියක් හා උද්ඝෝෂණයක් පැවැත්වූ බව වාර්තා වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර වහාම මැතිවරණයක් පැවැත්විය යුතු බව ඔවුන්ගේ අදහස වී ඇත. එරට ආරක්ෂක අංශ විසින් මෙම රැලිය පාලනය කර ඇති අතර ඇති වූ ගැටුම්වලින් 400ක් පමණ තුවාල ලබා ඇති බව පැවසේ.

දැනුම

විශ්වයේ බිහිවීම - 10 කොටස

පසුගිය forward කලාපයෙන් අප සාකච්ඡා කළේ සෞරග්‍රහ මණ්ඩලයට අයත් වාමනයන් පිළිබඳවය. මෙවර අප සාකච්ඡා කරනුයේ සෞරග්‍රහ මණ්ඩලයේ ඇති ග්‍රහක පටිය පිළිබඳවය.



# ග්‍රහක පටිය (කුයිපර් පටිය)

ග්‍රහක පටිය යනු සෞරග්‍රහ මණ්ඩලයේ අඟහරු හා බ්‍රහස්පති ග්‍රහයින්ගේ කක්ෂ අතර ප්‍රදේශයයි. එම ප්‍රදේශය තුළ අක්‍රමවත් හැඩැති වස්තූන් (ග්‍රහක) නැත්නම් කුඩා ග්‍රහලෝක ගණනාවක් දක්නට ලැබේ. සෞරග්‍රහ මණ්ඩලයේ වෙනත් කුඩා ග්‍රහලෝක එකතුවලින් කුයිපර් පටිය සහ විසිරුණු තැටිය වැනි එකතූන් වෙන්කර හඳුනාගැනීම පිණිස මෙම ග්‍රහක පටිය යොදා ගැනේ. එය ප්‍රධාන පටිය ලෙසද හැඳින්වෙයි.

ග්‍රහක පටියේ ස්කන්ධයෙන් අඩකටත් වඩා ගැබ් වී ඇත්තේ සෙරෙස්, වෙස්ටා 4, පල්ලාස් 2 සහ හයිජියා 10 යන විශාල වස්තූන් තුළය. මෙම වස්තූන් හතරටම කිලෝමීටර 400කට වඩා වැඩි මධ්‍යයන විෂ්කම්භයක් ඇති අතර ග්‍රහක පටියේ එකම කුරුමිටි ග්‍රහයා වන සෙරෙස්ගේ පවා විෂ්කම්භය කිලෝමීටර 900 කි. අනෙකුත් ග්‍රහක දූවිලි අංශුවක් දක්වා විවිධ ප්‍රමාණවලින් යුක්ත වේ. ග්‍රහක ද්‍රව්‍ය තුනී ලෙස පැතිරී ඇති බැවින් කිසිදු අනතුරකින් තොරව මිනිසුන් නොමැති අභ්‍යවකාශ යානා ගණනාවක්ම මේවා අතරින් ගමන් කර තිබේ.

කෙසේ වෙතත් විශාල ග්‍රහක අතර ගැටීම් ඇති වීමෙන් සමාන කක්ෂීය ලක්ෂණ හා සංයුතීන් සහිත ග්‍රහක පවුල් ඇති විය හැකිය. ඝට්ටන මඟින් සියුම් දූවිල්ලක් සෑදෙන අතර එය රාශි චක්‍රයෙහි ආලෝකයේ ප්‍රධාන සංඝටකයක් වේ. ප්‍රධාන පටිය තුළ ඇති ග්‍රහකවල වර්ණාවලිය අනුව ඒවා වර්ගීකරණය කෙරෙන අතර කාබන්, සිලිකා සහ ලෝහවලින් පිරිපුන් මූලික කාණ්ඩ 03කට ඉන් බොහොමයක් ඇතුළත් වේ.

ඊළඟ forward කලාපයෙන් අප සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ අඟහරුගේ හා බ්‍රහස්පතිගේ කක්ෂයන් අතර ඇති ප්‍රධාන ග්‍රහක පටිය පිළිබඳවයි.

විශ්වය තුළ අපේ ලිපිනය

| | | |
|---|---|---|
| 01 | පෘථිවිය | අපගේ විශ්වීය ලිපිනයේ පළමු පේළිය වන්නේ අපේ නිවහන වන පෘථිවියයි |
| 02 | සෞරග්‍රහ මණ්ඩලය | එහි දෙවන පෙළ වන්නේ පෘථිවියද ඇතුළු සමස්ත සෞරග්‍රහ මණ්ඩලයයි |
| 03 | ක්ෂීරපථ ගැලැක්සිය | එහි තුන් වන පෙළ වන්නේ අපගේ සෞරග්‍රහ මණ්ඩලයද ඇතුළු තාරකා බිලියනයකින් පමණ සමන්විත ක්ෂීරපථ ගැලැක්සියයි |
| 04 | දේශීය පොකුර | ක්ෂීරපථ ගැලැක්සියත් අපට ආසන්නතම ගැලැක්සිය වන ඇන්ඩ්‍රොමීඩා ගැලැක්සියත්, මේ විශාල ගැලැක්සි දෙක අහළ පහළ ඇති කුඩා ගැලැක්සිත් එකතු වූ විට එහි හතර වන පෙළ සැකසේ. |
| 05 | වර්ගෝ සුපිරි පොකුර | ඉහත සියල්ලම සහ අවට ඇති දහස් ගණනක මන්දාකිණී පොකුරට මෙම නාමය භාවිතා කෙරේ. එයයි පස්වැනි පෙළ. |
| 06 | නිරක්ෂීය විශ්වය | මන්දාකිණී බිලියන 100ක පමණ එකතුවක් තිබේ. එය අප දැනට විශ්වය පිළිබඳ තොරතුරු සොයාගෙන ඇති ප්‍රමාණය පමණයි. මෙය අපගේ විශ්වයේ ක්ෂිතිජය වේ. එතැනින් එහාට ඇති ග්‍රහ වස්තූන්ගේ ආලෝකය තවමත් මෙම විශ්වය නිර්මාණය වීමට ගත වූ වසර මිලියන 13.8 කාලය තුළ පෘථිවියට ළඟා වී නැත. |





# පංති වූ කලී

අප සමාජය තුළ ජීවත් වන විට කුමන හෝ පංතියකට අයත් වේ. කුමන හෝ පංතියක් වෙනුවෙන් සේවය කරයි. මොනයම් හෝ පංති අවශ්‍යතාවයක් නියෝජනය කරයි. පංතිය තුළ නියෝජනය නොවෙමින් කිසිවෙකුටත් සිටිය නොහැක. එනම් මධ්‍යස්ථවාදීන් යැයි පිරිසක් සමාජය තුළ නැත. විටෙක තම පංති අවශ්‍යතාවය වෙනුවෙන් නිහඬතාවය රකියි. තවත් විටෙක තම පංතිය වෙනුවෙන් සේවය කරයි. නමුත් තීරණාත්මක ඕනෑම මොහොතක තම පංතිය රැකගැනීම වෙනුවෙන් පෙනී සිටී. බේදවාචකය එය නොවේ. විශාල පිරිසක් තම පංතිය කුමක් දැයි හඳුනාගත නොහැකිව තමන්ව පීඩාවට පත්කරනු ලබන පංතිය වෙනුවෙන් කාලය ශ්‍රමය වැයි කරයි. ඔබ අප පංතිය වූ කලි කුමක්දැයි හඳුනාගැනීම අත්‍යවශ්‍ය වන්නේ එබැවිනි.

මෙතෙක් පැවැති සියලු සමාජවල ඉතිහාසය පංති අරගල ඉතිහාසයක් වේ යැයි මාක්ස් එංගල්ස් විසින් කොමියුනිස්ට් ප්‍රකාශයේ ආරම්භයේ දී ප්‍රකාශය කර ඇත. මේ අනුව මිනිස් වර්ගයාගේ ලිඛිත ඉතිහාසය යනු පංති සටන්වල ඉතිහාසයක් බව පැහැදිලිය. මානව සමාජයේ එක් අවස්ථාවක සිට දේපල මත පංති බෙදීම සිදුවූ අතර එම පංති අරගලයන් අදටත් පවතී.

සමාජය දේපල මත පංති හෙදී ඇතැයි සියලු දෙනා පිළිගනී. නමුත් පංතිය තෝරාගැනීමේදී එකිනෙකා තුළ ඇත්තේ පරස්පර විරෝධී අදහස්ය. පසුගිය කාලවකවානුව තුළ නව ලිබරල්වාදයේ ආගමනය නිසාත් සමාජවාදී සෝවියට් දේශය බිඳවැටීම නිසා මතුපිටින් සිදුවී ඇති වෙනස්කම් නිසාත් පංතිය පිළිබඳව විවිධ විග්‍රහයන් පළවේ. සමහරු පංතිය අහෝසි වී ඇතැයිද පවසයි. මෙයට මූලික හේතුව වී ඇත්තේ පංති විග්‍රහ කිරීමට යොදාගන්නා මිනුම්දණ්ඩ නිවැරදි නොවීම මතය. කෙනෙක් කරන රැකියාව හෝ කාර්යය අනුව ඔහුගේ මතුපිට පෙනුම හා සිතන මතන ආකාරය අනුව සමාජ පංති හඳුනාගත නොහැකිය. ලෙනින් විසින් පැහැදිලි නිර්වචනයක් මේ සඳහා සපයා ඇත. "පංති වූ කලී නිශ්චිත සමාජ ආර්ථික ක්‍රමයක් තුළ තම තමන් දරන තැන් අනුව එක්කොටසක තවත් පිරිසකගේ ශ්‍රමය අත්පත් කරගැනීමේ හැකියාව ඇති ජන කණ්ඩායම් වේ".

මේ අනුව අප පංතිය හඳුනාගැනීමේ දී භාවිත කළ යුතු නිර්නායකයන් කිහිපයකි.

01. නිශ්චිත සමාජ ක්‍රමයක් තුළ මිනිසුන් දරන ස්ථානය සමාජය තුළ ඉහළ තත්වයක් ද පහළ තත්වයක්ද යන වග.

02. නිෂ්පාදන මාර්ග කෙරෙහි ඇති සම්බන්ධතාවය හා සමාජ ශ්‍රම සංවිධානය තුළ ඔවුන් ඉටුකරන කාර්යය කුමක්ද යන වග.

උදා: නිෂ්පාදනයට දායක වන්නේ ප්‍රාග්ධන හිමිකරුවකු ලෙස ද නැතිනම් වැටුප් ශ්‍රමිකයෙකු ලෙසද

03. ඔවුන් සමාජ සම්පත් ලබාගන්නා ආකාරය හා එහි ප්‍රමාණය කොතරම්ද යන වග.

උදා: ඔවුන් සමාජ සම්පත් ලබාගන්නේ වැටුප් ලෙස නම් එහි ප්‍රමාණය කුඩා නම් ඔවුන් නිර්ධන පංතියට වැටේ.

ඔවුන් සමාජ සම්පත් ලබාගන්නේ ලාභ ලෙස නම් එහි ප්‍රමාණය විශාල නම් ධනපති පංතියට අයත් වේ.

මේ අනුව පැහැදි වන්නේ දේපලවලට ඇති සබඳතාවය නිෂ්පාදනයට දායක වන ආකාරය අනුව ධනපති නිර්ධන ලෙස පංති දෙකකට සමාජය බෙදී පවතින බවයි. මෙලෙස පංති බෙදීයාමේ දී විවිධත්වයක් පවතී. එනිසා අතුරු පංතීන්ද ඇතිවන බව මාක්ස්වාදීන් පවසයි. සුළු ධනේෂ්වර පංතියක් ගැන අදහස් මතු වන්නේ මේ නිසාය. නමුත් මේ සියල්ල තීරණය වන්නේ දේපලවලට ඇති සබඳතාවය මතය. මීට අමතරව සමාජ ස්ථර හා පැලැන්තිද තිබේ. මේවා සමාජ පංති සමඟ පටලවා ගැනීම අවිද්‍යාත්මකය.

බාහිර පෙනුම භාවිත කරන භාණ්ඩ හා උපකරණ තුළින් පමණක් තමා අයත් පංතිය තීරණය කිරීම අවිද්‍යාත්මකය. සමාජ ක්‍රමයක් පවත්වාගෙන යන ධූරාවලියක නියමු කාර්යභාරය කරනුයේ පංතිය විසිනි. එබැවින් නිර්ධන පංතිකයන් විසින් තම පංතිය නිවැරදිව හඳුනාගත යුතුය. නමුත් එය පහසු කාර්යයක් නොවේ. නිර්ධන පංතිය ධනපති පංතිය තුළ බොඳකර හරිමින් කටයුතු කරන ආකාරය තේරුම්ගත යුතුව ඇත.

---

## අප ජීවත් වී සිටින්නේ 12 පිටුවෙන්

නමුත් හරයෙන් එම ප්‍රතිචාර සමාන විය යුතුයි.

### නේපාලයේ පැවති අවසාන මහා සභා රැස්වීම (GC Meeting) ගැනත් සඳහන් කළොත් ?

වාර්ෂිකව පැවැත්වෙන WFDY හි මහා සභා රැස්වීමේ මූලික අරමුණ වන්නේ සංවිධානයෙ හි වාර්ෂික කටයුතු සමාලෝචනය කිරීමයි. වාර්ෂික සැලසුම් සකස් කිරීම සහ ප්‍රධාන දේශපාලනික කරුණු සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹීමයි. එයට අමතරව මෙවර මහා සභා රැස්වීමේදී විශේෂ කාර්යයක් ලෙස අවසන් වරට පැවති ලෝක තරුණ හා ශිෂ්‍ය උලෙළ පිළිබඳව සමාලෝචනයක් ද සිදු කළා.

මෙම මහා සභා රැස්වීම අතරතුර දී අපගේ සහෝදර සහෝදරියන් සමඟ දේශපාලනික සහ සංවිධානාත්මක සාකච්ඡා රාශියක් ද කරගැනීමට හැකියාව ලැබුණා. සාකච්ඡාවන් අවසානයේ අපගේ අවසන් මතය ලෙස පසුගිය උලෙළ යනු සාර්ථක වූවක් යනුවෙන් පොදු අදහසකට එළැඹුණා. කෙසේවෙතත් එහි සාර්ථක අවස්ථාවන් මෙන්ම ඍණාත්මක අවස්ථාවන් ද පැවති බවත් නිරීක්ෂණය කෙරුණා.

එමෙන්ම තවත් වැදගත්ම කාරණයක් ලෙස මෙහිදී අප විසින් දේශපාලන ප්‍රකාශයක් (political resolution) එළිදක්වනු ලැබුවා. එය ලෝකයේ වර්තමාන දේශපාලන තත්වය සහ ඉදිරියට ගනු ලබන ක්‍රියාමාර්ගවලින් සමන්විත වෙනවා.

### WFDY හි ඉදිරි ක්‍රියාමාර්ග ගැනත් සඳහන් කළොත්

WFDY හි මූලික අරමුණු දෙකක් තිබෙනවා. එකක් තමයි අපගේ ක්‍රියාකාරකම් වෙනුවෙන් අලුත් සංවිධාන එකතු කරගැනීම. අනෙක් දේ තමයි සංවිධාන පැවැත්ම හා එහි හඬ වැඩිදියුණු කරගැනීම.

WFDY බිහිවීමේ සිට මේ දක්වාම අධිරාජ්‍යවාදී විරෝධය වෙනුවෙන් විශාල වැඩකොටසක් කරලා තිබෙනවා. ඒ වගේම අපගේ ක්‍රියාවන් ලොව පුරා ප්‍රචලිත කිරීමටත් අවශ්‍යයි. ඒ පීඩාවට පත් තරුණයාට හඬක් අවශ්‍ය නිසයි. මේ සඳහා විශේෂයෙන්ම සමුළු, සාකච්ඡා, සහයෝගීතා මෙහෙයුම් ආදිය සංවිධානය කරනවා.

මොකද අප ජීවත් වෙන්නේ අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේ ප්‍රහාරයන් වඩාත් තීව්‍ර කරමින් සිටින මොහොතකයි. එම නිසා ඊට සාපේක්ෂව අපගේ ශක්තීන්ද වැඩි දියුණු කරගත යුතුයි.

### හොඳයි, අවසාන වශයෙන් ලොව පුරා අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් කරන තරුණයාට ඔබ දෙන පණිවිඩය මොකක්ද?

අධිරාජ්‍යවාදයට එරෙහිව කරන සටන පහසු එකක් නෙවෙයි. ඇත්තෙන්ම එය බොහෝ දුෂ්කරතාවලින් සමන්විත වූවක්.

සියල්ල නිර්මාණය කරන්නේ අපිමයි. අපගේ මහන්සියෙන්, අපගේ අත්වලින්, අපගේ මොළයෙන්. අපව සූරාකන, පීඩාවට පත්කරන මෙම ක්‍රමය ශක්තිමත් වී ඇත්තේ අපගේ හැකියාවන් බලෙන් උදුරා ගැනීමෙනුයි. අධිරාජ්‍යවාදීන් ශක්තිමත් නමුත් අපි ඊටත් වඩා ශක්තිමත්. ඔවුන්ට සම්පත් ඇතිමුත් අප අතර විශාල සහයෝගීතාවයක් (solidarity) තිබෙනවා. සමහරවිට ඔවුන් අපව අතීතයේදී පරාජයට පත්කර ඇති නමුත් අනාගතයේ ජයග්‍රහණය අපගේයි.

# තොඩුවාව ශාන්ත අන්තෝනි නවෝද්‍යා විදුහලට ක්‍රීඩා භාණ්ඩ



තොඩුවාව ශාන්ත අන්තෝනි නවෝද්‍යා විදුහල ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඉතාමත් අඩු පහසුකම්වලින් යුක්ත පාසලකි. එහි 15න් පහළ පිරිමි හා කාන්තා වොලිබෝල් කණ්ඩායම් වෙත ක්‍රීඩා භාණ්ඩ ප්‍රදානය කිරීම පසුගිය අගෝස්තු 26 දින සිදුකෙරුණි. ඒ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී සාගර විජේසේකර සහ සමාජවාදී තරුණ සංගමයේ පුත්තලම දිස්ත්‍රික් බලමණ්ඩලයේ ලේකම්, ප්‍රා. සභා මන්ත්‍රී ශනිල දිල්ෂාන් සහ එම විදුහලේ ආදි ශිෂ්‍ය සුමිත් හෙට්ටිගේ යන සහෝදරවරුන්ගේ මැදිහත් වීමෙනි. මේ සඳහා මූල්‍ය දායකත්වය සැපයුවේ ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකික සහෝදරවරුන් විසිනි.

# විෂමත් ද්‍රව්‍ය නැවැත්වීමේ පළමු පියවර ජවිපෙන්



කොට්කාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව තුළ පාසල් ළමුන් විශාල වශයෙන් විෂමත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා දරුවන්ගේ පාසල් ජීවිතය මෙන්ම අනාගතයත් අඳුරු වෙමින් පවතිනවා. මේ දරුණු ව්‍යසනයෙන් දරුවන් මුදාගැනීමේ අරමුණ ඇතිව, මේ පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සමාජවාදී තරුණ සංගමයේ කොලොන්නාව ආසන බලමණ්ඩලයේ භාණ්ඩාගාරික, කොට්කාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි නිල්මිණි ගර්ලැක් සහෝදරියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා මුල්ලේරියාවේදී පැවැත් විය. ඒ සඳහා දෙමාපියන් විශාල ප්‍රමාණයක් සහභාගී වූ අතර වැඩසටහන ඉතා සාර්ථක බවත්, මෙවැනි වැඩසටහන් පාසල් මට්ටමට රැගෙන ගොස් සියලු පාසල් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා පැමිණ සිටි දෙමාපියන්ගේ දායකත්වය ලබා දෙන බවත් ප්‍රකාශ කර ඇත.

# ඇල්ලටත් කුණු කන්දක්



ස්වභාවික සුන්දර පරිසර පද්ධතියකට හිමිකම් කියන ඇල්ල නගරය ශ්‍රී ලංකාවේ ඔක්සිජන් සාන්ද්‍රණය හොඳින් ලැබෙන ස්ථාන අතුරෙන් එකක්. නමුත්, අද අපට ඒ භූමියේ සුන්දරකම පිළිබඳ සාකච්ඡා කිරීම වෙනුවට මේ සුන්දරත්වය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සටන් කිරීමට සිදුවී තිබෙනවා. ඇත්තෙන්ම එය ඛේදවාචකයක්. මේ වන විට ඇල්ල නගරයට පිවිසෙනවාත් සමගම අපට දැකගැනීමට හැකි වන්නේ දුර්ගන්ධයෙන් පිරි කසල කන්දකි. මීට පෙර පැවති ප්‍රාදේශී සභාවලින් නගරය තුළ එකතු වන කසල ප්‍රතිචක්‍රීයකරණය කිරීම සඳහා කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් ආරම්භ කලද එය නමට පමණක් සීමා වූ මධ්‍යස්ථානයක් බවට පත්වී හමාරයි. තවද, ඇල්ල නගරයේ සියලුම ව්‍යාපාරික ස්ථානවල අපද්‍රව්‍ය බැහැර කරන්නේ ඇල්ල හරහා ගලා බසින කිරිඳි ඔයේ අතු ගංගාවටයි. එලෙසම නගරයේ කාණු පද්ධතිය බැහැර වෙන්නේත් මේ ගංගාවටමයි. තවද ඇල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩා නගර කීපයකම අපද්‍රව්‍ය බැහැර කරන්නේ ඇල්ලට සම්බන්ධ බදුලු ඔයටය. මේ හේතූන් නිසා නගරය තුළ විශාල ලෙස සනීපාරක්ෂක ගැටලු පැන නගිමින් පවති.

දේශීය විදේශීය සංචාරකයින් බොහෝ ප්‍රමාණයකගේ අනිවාර්ය නවාතැන් පොලක් වන ඇල්ල නගරය තුළ පොදු වැසිකිලියක්, ප්‍රධාන මාර්ගය සඳහා පදික වේදිකාවක් නොමැති කම සහ වැසි දිනවල කසල කන්ද නිසා නගරයේ ඇතිවන දුර්ගන්ධය නිසා සංචාරකයින් මෙන්ම පොදු ජනතාවත් අපහසුතාවයට පත්වන බව ජ.වි.පෙ. ඇල්ල ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු ගිම්හාන සහෝදරයා පැවසීය. ඔහු මේ බව පැවසුයේ පසුගියදා පැවති ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමකදීය.



# පාරාදීසය කොහිද?

හුදෙකලාවේ සිරගත වීමට අකමැති මිනිස්සු කැමැත්තෙන්ම සිරබත් කන බවක් ඔයා අහලා තියෙනවද? සත්තකින්ම, පාරාදීසයක් වගෙයි කියපු ධනවාදය තුළත් ඒ වගේ ඛේදජනක ආරංචියක් අහන්න ලැබේවි යි කියලා, ඔයාට අංශුමාත්‍රයක තරම්වත් සැකයක් දැනුණෙ නැහැ නේද? ඒත්..... කණගාටුවෙන් වුනත් කියන්න ඕනා, ඔයාට එතනදි වැරදුණා කියලා. හරි.... තවමත් විශ්වාස නැත්නම් අද පින්තූරයේ කථාව කියවලම බැලුවොත්, ඔයාටත් තේරේවි මේ කියන්න හදන්නේ මොකක් ගැනද කියලා.

මේ තියෙන්නේ ජපානයේ බන්ධනාගාරයක ඡායාරූපයක්. ඇත්තටම ජපානය කියලා කියන්නේ ධනවාදයේ හිණිපෙත්තටම ගියපු දියුණු රටක්. ඒත් අද වෙනකොට ඔවුන් මුහුණ දීලා ඉන්න සමාජ අර්බුදය කියලා කියන්නේ මානව ඉතිහාසයේ දැවැන්තම ඛේදවාචකයක්. තාක්ෂණ හා මූල්‍යමය ක්ෂේත්‍රය තුළ හැල්මේ දුවගෙන යනකොට ජපානයට තමන්ගේ සමාජ ජීවිතය අතහැරිලා.

පසුගිය දිනෙක එළිදැක්වුණු බ්ලූම්බර්ග් (ඉකදදපඉමරට) වාර්තාවකින් කියවුණේ ජපානයේ වියපත් ජනගහනය, ඒ කියන්නේ වයස අවුරුදු 60 ඉක්මවූ අය, හිතාමතාම යම්කිසි සුළු වරදක් කරලා බන්ධනාගාරගත වෙන්න කැමැත්තක් දක්වන බවයි. ඒකට හේතුව වෙන්නේ අපි අර කලින් කියපු හුදෙකලාවේ සිරගත වීමට වඩා හිරබත් කෑම සැපතක් වීමේ ඛේදවාචකයයි. මොකද ජපන් ජනතාවට දරුවො හා දෙමව්පියො අතර, සහෝදර සහෝදරියන් අතර, නෑදෑ හිතමිතුරන් අතර තමන්ගේ සමාජ සම්බන්ධතා නඩත්තු කිරීමට තරම් වෙලාවක් ඉතිරි වී නැහැ. ඒ නිසා බොහෝ වයස්ගත පුද්ගලයින් කාලය ගෙවන්නේ තනිවමයි. ඉතින් ඔවුන්ව වෙලාගත්ත ඒ දරුණු හුදෙකලාවෙන් මිදෙන්න, අඩුම තරමින් තමන්ට කතාබහ කරමින් කාලය ගත කරන්න කෙනෙක් හොයාගන්න පහසුම ක්‍රමය විදියට මේ වැඩිමහල්ලො තෝරාගත්තේ සිපිරිගෙයයි.

කොහොම වුනත් ගත වුණු දශක දෙක ඇතුළෙ එරට වියපත් සිරකරුවන් ගණන 04 ගුණයකින් වැඩි වෙලා. කොටින්ම කිව්වොත් ජපානයේ බන්ධනාගාර සේවකයින් පවසන්නේ තමන් දැන් වැඩිහිටි නිවාසයක රාජකාරි කරන්නන්ගේ මට්ටමකට පත් වෙලා කියලයි.

ඒ වගේම ජපන් වැසියන්ගෙන් බොහෝ දෙනෙක් විවාහ වීමට අකමැත්තක් දක්වන බවත් හෙළි වෙලා තියෙනවා. ඒකට හේතුව විදියට ඔවුන් කියන්නේ අධික ජීවන වියදම වගේම තරඟකාරී හා කාර්යබහුල ජීවන රටාවක් ගෙවීම නිසා ජපන්නු මේ විදියට මානව සබඳතාවයන්ගෙන් ඈතට පලා ගිය බවයි. ජපන් වැසියන්ගේ මේ හුදෙකලාව කොයිතරම්ද කියනවා නම් 1985 ඉඳන් 2015 වසර වෙනකොට එරට හුදෙකලාව ජීවත් වන්නන්ගේ ප්‍රතිශතය 600%කින් ඉහළ ගිහින් තිබුණා.

දැන් මේ ප්‍රශ්නය ධනවාදයට එරෙහි විශාලතම අභියෝගයක් බවට පත් වෙලා. ඒ කොයිතරම් ද කියනවා නම්, මේ වෙනකොටත් ලෝකයේ ප්‍රථම "හුදෙකලාව සම්බන්ධ කටයුතු භාර ඇමතිවරයා" පත්කිරීමට බ්‍රිතාන්‍ය රජයත් කටයුතු කරලා තියෙනවා.

ඉතින් ඔබම කල්පනා කරලා බලන්න, ඔබ හිතපු පාරාදීසය මේ ධනවාදය ඇතුළෙ ඇත්තටම තියෙනවද කියලා....

# රට රකින්නේ ජාතිවාදයෙන් ද? ජාතික සමගියෙන්ද?

'එක රටක් මනුපවුරක්' වැඩසටහන යටතේ "රට රකින්නේ ජාතිවාදයෙන්ද? ජාතික සමගියෙන්ද?" මැයෙන් සම්මන්ත්‍රණයක් බලංගොඩ නගරයේදී පැවැත්වීය. එහි දී ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයා, තරුණ හින්දු සම්මේලනයේ ප්‍රධාන ලේකම් ආචාර්ය සතීශ්කුමාර් සිවලිංගම් මහතා, කලීල් රහුමාන් මව්ලවිතුමා, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා හා සමාජවාදී තරුණ සංගමයේ රත්නපුර දිස්ත්‍රික් සංවිධායක විශ්ව කුමාර සහෝදරයා විසින් අදහස් දක්වන ලදී. සම්මන්ත්‍රණය සමාජවාදී තරුණ සංගමයේ රත්නපුර දිස්ත්‍රික් බලමණ්ඩලය මඟින් සංවිධානය කළ අතර ඒ සඳහා විශාල පිරිසක් සහභාගී වූහ. එම අවස්ථාව පහත ඡායාරූප මගින් දිස්වේ.



## සය මාසික නාට්‍ය හා රංග කලා වැඩමුළුව පුත්තලමේ දී




සය මාසික නාට්‍ය හා රංග කලා වැඩමුළුවක් නොමිලේ පැවැත්වීමට සමාජවාදී තරුණ සංගමයේ පුත්තලම දිස්ත්‍රික් බලමණ්ඩලය විසින් කටයුතු යොදා ඇත. මෙය සැප්තැම්බර් මස 09 දින දංකොටුව, සංස්කෘතික මධ්‍යස්ථානයේදී ආරම්භ කෙරුණි. ඒ සඳහා වයස අවුරුදු 15 - 45 අතර පිරිස් බඳවා ගැනුණු අතර සම්පත් දායකයින් ලෙස ප්‍රවීණ කලාකරුවන් රැසක් ඊට තම දායකත්වය ලබාදීමටද කැමැත්ත ප්‍රකාශ කර තිබුණි.

## මනු පවුරෙන් සෞඛ්‍ය කඳවුරක්



සමාජවාදී තරුණ සංගමයේ මාතර දිස්ත්‍රික් බලමණ්ඩලය මඟින් විසින් "මනු පවුර සෞඛ්‍ය කඳවුර" යන මැයෙන් සෞඛ්‍ය කඳවුරක් පැවැත් වීය. ඒ හක්මන බමුණුගම ශ්‍රී විජයාරාම විහරස්ථානයේදීය. මෙහි දී ලේ දන්දීමේ, අක්ෂි සායන, සෞඛ්‍ය දේශන ආදී වැඩසටහන් රැසක් පැවැත්වූ අතර ප්‍රදේශයේ ජනතාව හා තරුණයින් විශාල පිරිසක් ඊට සහයෝගය දැක්වූහ.

## විෂමත් විරෝධී ජනපවුරට SYU සහාය



විෂමත් විරෝධී ජන පවුර මඟින් පසුගිය සැප්තැම්බර් 02 වන දා විෂමත් විරෝධී උද්ඝෝෂණයක් සංවිධානය කොට තිබුණි ඒ පනාගොඩ නගරයේදීය. ජවිපෙ පනාගොඩ දිරිය පුරවැසි සමිතිය, සිවිල් සංවිධාන හා පුද්ගලයින්, ආගමික නායකයින් එක්ව මෙම ජන පවුර ගොඩනැගීය. කෙසේ වුවද අද සටනක් අවශ්‍යව ඇත්තේ එල්ලුම්ගස් යවන්න හදන තරුණ පරම්පරාව එල්ලුම් ගහෙන් බේරා ගැනීමටත් අප රටේ අස්සක් මුල්ලක් නෑරට පැතිරී ඇති විෂමත් සතුරාගෙන් රට බේරාගැනීමටත් බව සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික අංජන අමරසිංහ සහෝදරයා එහිදී පැවසීය. එම අවස්ථාවට ප්‍රදේශයේ විශාල පිරිසක් එක් වී සිටියහ.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.